# 8. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

## 8.1 ප්‍රතිපත්ති කාර්ය සාධනය

මිල ස්ථායිතාවය හා විදේශ අංශයෙහි අඛණ්ඩ පැවැත්මක් සහිත චිරස්ථායි ආර්ථික වර්ධනයක් යන සාර්ව ආර්ථික අරමුණු හා ඒකාග්‍රතාවයක් ඇතිවන පරිදි අයවැය හිඟය අඩුකර ගැනීමේ අපේක්ෂාවෙන් යුතුව මධ්‍යකාලීන ආර්ථික රාමුවක් තුල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කරනු ලැබිණි. 1995 අයවැය කථාවෙන් ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යකාලීන අයවැය රාමුව රාජ්‍ය මූල්‍ය කටයුතුවල ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරදි කිරීම අවධාරණය කරන ලදී. දේශීය ණය ගැනීම් මත පැටවෙන පීඩනය ලිහිල් කිරීම පිණිස සමස්ථ අයවැය හිඟය අඩු කර ගන්නා අතරම ශක්තිමත් ආදායම් වර්ධනයක් නොකඩවා පවත්වා ගැනීම සහ මෙහෙයුම් වියදම් සීමාකර ගැනීම මගින් රාජ්‍ය ආයෝජන ආරක්ෂා කර ගැනීම ද මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ගැලපුම් ප්‍රයත්නයන්හි අරමුණු විය. මෙම තත්ත්වය යටතේ වර්තන ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.6 ක අතිරික්තයකට හැරවීම, 1994 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 ක්වූ සමස්ත අයවැය හිඟය 1995 දී සියයට 7.5 ක් දක්වා අඩුකිරීම සහ මූල්‍යකරණය සඳහා බැංකු අංශයෙන් අරමුදල් ලබා ගැනීම රුපියල් දශලක්ෂ 7,405 කින් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1 කින් අඩු කිරීම මගින් රාජ්‍ය මූල්‍ය අසමතුලිතාවයෙහි සැලකියයුතු අඩුවීමක් 1995 රාජ්‍ය අයවැය ලේඛණයෙන් බලාපොරොත්තු විය.

අයවැය පරතරය අඩුකර ගැනීම සාක්ෂාත් කරගැනීම සඳහා 1995 වර්ෂය තුලදී, රජය විසින් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. ආදායම් අංශය ගත් කල පිරිවැටුම් බද්දෙහි අවම අනුපාත කාණ්ඩය, පෙට්‍රල් හා පාරිභෝගික භාණ්ඩ මත නිෂ්පාදන බද්ද, ආරක්ෂක බද්ද සහ මෝටර් රථ මත ආනයන තීරුබදු ඉහළ නංවන ලද අතර ඩීසල් මත නිෂ්පාදන බද්දක් හඳුන්වා දෙන ලදී. අනුක්‍රමවත් ලෙස සිදු කරන ලද තීරුබදු අත්හැරීම් යාථාර්තවත් කිරීම මගින් ආනයන තීරුබදුවල බදු පදනම ශක්තිමත් කරන ලදී. රේගුව මගින් ආරක්ෂක බද්ද අයකර ගැනීම තුලින් එම බද්ද ක්‍රමවත් කරන ලදී. ඩීසල් මිලෙහි අන්තර්ගතව ඇති සහනාධාරය ආපසු ලබා ගැනීම පිණිස පොදු ප්‍රවාහන සඳහා යොදාගනු ලබන ඩීසල් වාහන හැර අනෙකුත් ඩීසල් වාහන මත නව බද්දක් පනවන ලදී. තවද, සාපේක්ෂ වශයෙන් සමාජයේ ආර්ථිකමය ශක්තියෙන් වැඩි අය මත පැනවෙන පරිදි සුඛෝපභෝගී මෝටර් රථ සඳහා බද්දක් පනවන ලදී. බදු නොවන ආදායම් ඉහළ මට්ටමක පවත්වා ගැනීමේ ප්‍රයත්නය තිරසාර වන පරිදි, පරිපාලන ගාස්තු හා අයකර ගැනීම් ඉහළ නංවන ලදී. තෝරාගත් රාජ්‍ය වෙළඳ ව්‍යවසායන් මතද බදු පනවන ලදී.

වියදම් අංශය ගත් කල, රජයේ මෙහෙයුම් වියදම් සීමා කිරීමට අතිරේකව, භාණ්ඩ හා සේවා මිලට ගැනීම, මෝටර් රථ හා උපකරණ මිලට ගැනීම සහ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් වැනි ප්‍රමුඛතාවයෙන් අඩු ප්‍රාග්ධන වැඩසටහන් සඳහා යන වියදම සියයට 10 කින් කපා හැරීම සිදු කරන ලදී. සුභසාධක වියදම් ඉලක්කගත කිරීම සහ තිරිඟු පිටි මත විශාල සහනාධාරයක් පැන නැගීම සීමාකර ගැනීම පිණිස, තිරිඟු පිටිවල පාලන මිල ගැලපීමද සිදු කරන ලදී

රේගු බදු, නිෂ්පාදන බදු, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ රජයේ සුභසාධන වැඩසටහන් සම්බන්ධව ඉතා වැදගත් ව්‍යුහමය ප්‍රතිසංස්කරණයන් කිහිපයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සාධනයට අඩංගු විය. තීරුබදු අත්හැරීම් භාවිතය සීමා කිරීමට අතිරේකව බොරතෙල් හැර අනෙකුත් භාණ්ඩ සඳහා රේගුබදු අයකිරීම වටිනාකම පදනම් කොට සිදු කිරීමේ ක්‍රමයකට පරිවර්තනය කරන ලදී. ඉහළම සම්මත රේගු බදු අනුපාතය වූ සියයට 45, සියයට 35 දක්වා අඩු කරන ලද අතර ශීර්ෂයන් කිහිපයක රේගු බදු සියයට 10, 20 සහ 35 ක් වූ සම්මත අනුපාත ව්‍යුහයන් 3 අතරට ගැනෙන ලෙස පහත හෙලන ලදී.

වසර අවසානයේදී භාණ්ඩ විශාල සංඛ්‍යාවක් නිෂ්පාදන බදු වලින් ඉවත් කිරීමත් සමග, බදු පරිපාලනය වැඩිදියුණු කරමින් සහ දේශීය කර්මාන්ත මත පැවති ඉහළ බදු බර අඩු කරමින්, නිෂ්පාදන බදුවල පුළුල් ප්‍රතිසංස්කරණයක් සිදු කරන ලදී. දේශීය බීර කර්මාන්තය මත ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා ඊට අහිතකර ලෙස බලපාන සුරාබදු අඩු කරන ලදී. බදු පරිපාලනය වැඩි දියුණු කිරීම හා සරල කිරීම පිණිස සකස් කල දුම්කොළ සහ සිගරට් මත වෙන් වෙන්ව පැවති බදු අයකිරීම, සිගරට් විකුණුම් මත එක් අදියරකදී පමණක් අය කෙරෙන බද්දක් ලෙස ඒකාබද්ධ කරන ලදී.

ප්‍රාග්ධන සංචලනය දිරි ගැන්වීම, වැදගත් ව්‍යවසායන් සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය පුනර්ජීවනය කිරීම සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම අරමුණු කොට යටිතල පහසුකම් සැපයීම, වැවිලි සහ වාණිජමය කටයුතුවල නියැලුන ව්‍යවසායන් ආවරණය වන පරිදි රජය විසින් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහනක් දියත් කරන ලදී. එකී ප්‍රතිසංස්කරණයන් නීති ප්‍රකාරව සිදු කරනු පිණිස, අවශ්‍ය ආයතනික සකස් කිරීමක් ලෙස රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කාර්ය සාධක අංශය ව්‍යවස්ථානුකූලව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම බවට පරිවර්තනය කරන ලදී.

රාජ්‍ය මූල්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණයන්හිදී රාජ්‍ය සුභසාධන වැඩපිළිවෙල කෙරෙහි ද සැලකිල්ල යොමු කරන ලදී. දිළිඳුකම තුරන් කිරීම සඳහා ඉතා හොඳින් ඉලක්ක කරන ලද වැඩ සටහනක වැදගත්කම හඳුනා ගනිමින් රජය මගින් ආහාර හා භූමිතෙල් මුද්දර, පාසැල් දිවා ආහාර සහ ජනසවිය වැඩපිළිවෙලවල් වෙනුවට සමෘද්ධි වැඩ සටහන හඳුන්වා දෙන ලදී. මෙම වැඩ සටහන මගින් රජයේ සෘජු ආධාර ලබාදීම සඳහා උතුරු-නැගෙනහිර පළාත් හැර අනෙකුත් ප්‍රදේශ වලින් දශලක්ෂ 1.2 ක පවුල් සංඛ්‍යාවක් ඉලක්ක කොට ඇත.

## 8.2 අයවැය තත්ත්වය

1995 වර්ෂයේ දී රාජ්‍ය මූල්‍ය කටයුතු, රාජ්‍ය මූල්‍ය අංශය වඩාත් ශක්තිමත් කරමින් සැලකිය යුතු දියුණුවක් ඇති කළේය. ඉකුත් වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.9 ක් වූ වර්තන ගිණුමේ හිඟය, 1995 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5 දක්වා පහත වැටිණ. 1994 වර්ෂයේ දී සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 සිට 1995 වර්ෂයේ දී සියයට 8.4 දක්වා පහත වැටිණ.

විවිධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්ගේ බලපෑම යටතේ පෞද්ගලික ආදායම් බදු සහ දේශීය භාණ්ඩ හා සේවා මත බදු මූලාශ්‍රයන්හි ඇති වූ ශක්තිමත් ආදායම් වර්ධනය

## සහනාධාර සමාජ ආරක්ෂණ දැලක් ලෙසින්

**විශේෂ සටහන 4**

සමානාත්මතාව පුරුකෙන, ඉහළ මට්ටමක තිරසාර ආර්ථික වර්ධනයක් තුලින් ජීවන තත්ත්වය නගාසිටුවීම ආර්ථික ප්‍රතිපත්තියක අවසාන ඉලක්කය වේ. ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභයන් සමාජයේ දිළිඳුතම කොටස් වෙත ලැබීමට සැලැස්වීම බෙහෙවින් අවශ්‍ය දෙයකි. කෙසේ වුවද ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ ඉහළ සිට පහලට ගලායාමේ ක්‍රියාවලිය තුළ අඩුලුහුඩුකම් පවතින අතර සමහර අවස්ථාවලදී ජනගහනයෙන් ඇතැම් කොටස්වලට එම ප්‍රතිලාභයන් අහිමිවීම් දක්නට ලැබේ. එබැවින් එවැනි කණ්ඩායම්වල අයිතින් ආරක්ෂා කිරීම රජයක සදාචාරාත්මක වගකීමකි. දිළිඳු හා දුබල ජනකොටස් වලට සහනාධාර මගින් ආධාර සැපයීම ශ්‍රී ලංකාවේ සෑම රජයටකම න්‍යාය පත්‍රයේ මුල්තැනක් හිමිවිය.

සුභසාධන ආධාර ලැබීමට සුදුසුකම් ලබන ජනතාව කාණ්ඩයන් දෙකකට වර්ග කළහැක. එනම්, (1) ස්ථිර දිළිඳු - එනම් වයස්ගත පුද්ගලයන්, නිදන්ගත අසනීපවලින් පෙලෙන්නන්, රෝගීන්, ආබාධිතයන්, අනත්දරු සහ පවුලේ ආරක්ෂාව අහිමිවූ ළමුන් ඇතුළු යැපෙන ජනගහනය, සහ (II) තාවකාලික දිළිඳු - එනම් ආර්ථිකමය රැකියාවක නියුක්ත වියහැකි වුවද, විවිධ හේතූන් නිසා දරිද්‍රතා සීමාවට පහළ සිටින ජනතාව, වශයෙනි. මෙම කණ්ඩායම් දෙක සඳහා අවශ්‍ය ආධාර සැපයීම, සමාජ සුභසාධන යෝජනා ක්‍රමවල ඉලක්කය විය යුතුය. ප්‍රථම කාණ්ඩය සඳහා ස්ථිර සුභසාධන වැඩසටහනක් අත්‍යවශ්‍ය වේ. කෙසේවුවද, දෙවන කණ්ඩායම සඳහා වඩාත් සුදුසු වන්නේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් මගින්, එම ජනතාවගේ ආදායම් මාර්ග වැඩි කර ගැනීමේ අවස්ථා සලසාදීමය.

දෙවන ලෝක යුද්ධ සමය තුළ යටත් විජිත ආණ්ඩු විසින්, දෙනු ලැබූ සහල් සලාක යෝජනාක්‍රමය සහ ආහාර සහනාධාර යෝජනාක්‍රම වැනි සහනාධාර ක්‍රමවලින් නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් රජයන්හි ප්‍රතිපත්තිවලට සෘජු පලපෑමක් ඇතිවිය. ආනාරක්ෂිත කාලයක සහන අවශ්‍ය පුද්ගලයන්ට ආධාර කිරීමේ ක්‍රමය, සමාජය විසින් විශාල ලෙස වරදවා තේරුම්ගෙන ඇත. මෙය රජයක අනිවාර්ය ත්‍යාගශීලිභාවයක් වශයෙන් අර්ථ දක්වන ලද අතර එය රජයේ සංවර්ධන වැඩසටහන්වල අවශ්‍යම කොටසක් බවට පත්විය. මේ නිසා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, (ප්‍රධාන වශයෙන් සහල්) නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවා සහ සහනදායි පොදු ගමනාගමන සේවා වැනි සුභසාධක සේවාවන් වෙනසකින් තොරව සියළුම ජනකොටස් වලට ලබාදීම සඳහා, නිදහසින් පසු බලයට පැමිණි සියළුම රජයන්ට බල කෙරුණි. කෙසේවුවද මෙම ප්‍රතිපත්තීන් රටේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හේතු විය. රටේ ආර්ථික වර්ධනය සිත්ගන්නා සුළු නොවුවද අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි සමාජමය මිණුම් අනුව ශ්‍රී ලංකාව ඇගේ අසල්වැසි රටවල් අභිබවා යන තත්ත්වයක් ළඟාකර ගත්තාය. මේ අතර නිරන්තරයෙන් වර්ධනය වූ ජනගහනය වෙත වෙනස්කමකින් තොරව සපයන ලද සුභසාධන සේවා සඳහා නොකඩවා වැඩිවූ පිරිවැය, ආයෝජනය සහ සංවර්ධනය සඳහා යොදාගතයුතු සම්පත් ඉවතට යොමු කරමින්, රාජ්‍ය අයවැය මත සැලකියයුතු පීඩනයක් ඇති කළේය.

1970 ගණන්වල අගභාගයේදී විවෘත ආර්ථික ප්‍රතිපත්තිනට මාරුවීමත් සමග වෙළෙඳපොල කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීමට ඉඩ සලසනු පිණිස මිල සහනාධාරයන් මගින් ඇතිකල විකෘති කිරීම් ඉවත් කරන ලදී. රජයේ වියදම් ප්‍රතිපත්තියෙහි එක් ප්‍රධාන ලක්ෂණයක් වූයේ, ඉලක්කගත සහනාධාර සහ ආදායම් පැවරීමේ වැඩසටහන් මගින් දිළිඳු ජනතාව ආරක්ෂා කරන අතරම සුභසාධන වියදම් යථාර්තවත් කිරීමයි. 1986 වන විට සුභසාධන වැඩසටහන්, ක්‍රමානුකූල කරල ලදී. මනා ලෙස ඉලක්ක කරන ලද ආහාර මුද්දර , භූමිතෙල් මුද්දර, පාසැල් වාරප්‍රවේශ පත්‍ර, දිවා ආහාර සහ පාසැල් ළමුන් සඳහා නොමිලයේ පාසැල් පොත් මෙන්ම ළදරු කිරිපිටි සහනාධාරයද, මෙම වැඩසටහන්වලට ඇතුළත් විණි. කෙසේවුවද, ක්‍රමයෙන් සියළුම පාසැල් ළමුන් සඳහා නොමිලේ නිලඇඳුම් සහ මෑතකදී මුළු ජනගහනයටම තිරිඟුපිටි සහ පාන් සහනාධාරය වැනි දෑ ලබාදීම මගින් නැවත වරක් සියළුම ජනකොටස් ආවරනය වන පරිදි සමාජ දැල පුළුල් කරන ලදී.


1994 දී පොදු පිටි සහනාධාරය හඳුන්වාදීමත් සමඟ අඩු ආදායම් ලබන කාණ්ඩයන්හි ජීවන වියදම පහත වැටුණු නමුත් එය වෙනත් බොහෝ සංකීර්ණතාවයන් ඇති කිරීමට මූලික විය. මින් ඉලක්ක ගත සහනාධාර පිළිබඳ සංකල්පයෙන් බැහැරවීමක් මෙන්ම නැවත වරක් සම්පූර්ණ ජනගහනය සහනාධාර ලබන්නන් බවට පරිවර්තනය කිරීමක් විය. ඇත්ත වශයෙන්ම තිරිඟු පිටි පාරිභෝගිකයන්ගේ සංයුතිය සළකන කල මෙම සහනාධාරය ලබන ජනතාවගෙන් වැඩි කොටස ඉහළ ආදායම් කාණ්ඩයනට අයත් බව පෙනී යයි. එපමනක් නොව මෙම සහනාධාරය නිසා සහල් සහ අනෙකුත් ආහාර භෝගවල සාපේක්ෂ මිළ ද විකෘති විය. මීට අමතරව , සම්පත්වල ඇති සීමාකම් හේතුවෙන් මෙම සහනාධාරය නොකඩවා පවත්වාගෙන යාම ගැටළුවක්ව පවතින අතර මෙම තත්ත්වය ඉතා ඉක්මණින් නිවැරිදි කිරීමේ පියවරක අවශ්‍යතාව ද මතු වී ඇත. ක්‍රමානුකූලව මෙම සහනාධාරය ඉවත් කිරීමේ ක්‍රියාමාර්ගයක් 1995 අග භාගයේදී ආරම්භ කල අතර එය දැනට ක්‍රියාත්මකවෙමින් පවතී. 1995 දී මෙම සහනාධාරය වෙනුවෙන් දරණ ලද සෘජු පිරිවැය රුපියල් දශලක්ෂ 5,000 ක් විය.

සමස්ථයක් වශයෙන්, දුර්වල ලෙස ඉලක්ක කිරීම හා සම්පත් සීමාවීම බොහෝ සහනාධාර වැඩසටහන්වල චිරස්ථායි පැවැත්ම කෙරෙහි තර්ජනයක් වූ අතර ඒවායේ නියම ප්‍රතිලාභ කාලයත් සමඟ අඩුවීමට ද හේතු විය. තවද, මෙම සමහර සහනාධාර නිමක් නොමැතිවීම ශ්‍රම වෙළෙඳපොලට ද බලපෑම් ඇති කරමින් සම්පත් බෙදා හැරීම විකෘති කිරීමටද හේතු විය. මේ නිසා ඉතා මෑත කාලයේදී රජයේ මැදිහත් වීම, යොමු වූයේ නිවැරදි ලෙස ඉලක්ක ගත කිරීම තුළින් සහනාධාර වැඩසටහන්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ ජනතාවගේ අදායම් ඉපයීමේ අවස්ථාවන් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව එවැනි වැඩසටහන් කෙරෙහි ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීමටය. 1989 දී ආරම්භ කරල ලද ජනසවිය වැඩපිළිවෙලෙහි මෙන්ම 1996 දී හඳුන්වා දෙන ලද සමෘද්ධි වැඩසටහනෙහි තේමාව මෙය විය. අවශ්‍ය මූලික පහසුකම් සැපයීම මගින් දිළිඳු ජනතාව නිෂ්පාදන ක්‍රියාවලියට අවතීර්ණ කරවීම මේ මගින් අපේක්ෂා කරයි. සමාජමය තේරීම් ක්‍රියාවලියක් මගින් මෙම වැඩසටහන නිසි ලෙස ඉලක්කගත කිරීම ද සිදුවිය. මෙබඳු සමාජයීය තේරීම් ක්‍රියාමාර්ගයක් තුළින් සමාජයේ බලගතු කණ්ඩායම්වලින් කෙරෙන බලපෑම්ද අවම කරගත හැකි බව ජනසවිය හා සමෘද්ධි වැඩසටහන් පෙන්වා දෙයි. මෙම වැඩසටහන්වල අරමුණ සමාජ ආරක්ෂණ දැලක අවසාන පරමාර්ථය වන තාවකාලික දිළිඳු ජන කොටස වෙත ආදායම් ඉපැයීමේ අවස්ථාවන් සලසා දීමෙන් ඔවුනට දිළිඳු බවේ සීමාවෙන් ඉහළට ඒමට ආධාර කිරීමේ ප්‍රතිපත්තිය සමඟද හොඳින් ගැලපේ.

සහතෝරාගත් රාජ්‍ය ව්‍යවසායන් මත පැනවූ බදු හේතුකොට රජයේ ආදායම 1994 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19 සිට 1995 වර්ෂයේ දී සියයට 20.6 දක්වා වැඩි විය. කෙසේ වුවද, අළුතින් හඳුන්වා දුන් විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී සිදුවූ ප්‍රමාදයන් නිසා ඒවායේ පූර්ණ වාර්ෂික බලපෑම රාජ්‍ය ආදායම් රැස්කිරීමේ ප්‍රයත්නයන්හිදී පිළිබිඹු නොවිය. ආරක්ෂක සහ ඊට අදාල අනෙකුත් වියදම් ඉහළ යාම, රජයේ සේවකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් මත වැඩි වූ පිරිවැය, ආහාර සහනාධාර සඳහා වූ ඉහළ වියදම් සහ දේශීය ණය මත පැටවුන තිරසාර පොලී බර සහිත තත්ත්වයක් යටතේ වර්තන වියදම් පසුගිය වර්ෂයේ පරිදිම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 22 ක් පමණ විය. ඒ අනුව අයවැයෙහි වර්තන ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5 ක් විය.

වර්තන ගිණුමේ හිඟය සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.9 ක් වූ රාජ්‍ය ආයෝජන එක්ව ගත්කල, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ මත ලැබීම් සහ රජය මගින් වාණිජ ව්‍යවසායන්ට පෙර වර්ෂ වලදී දෙනු ලැබූ ණය ආපසු ලැබීම් හේතුකොට 1995 වර්ෂයේ දී සමස්ත අයවැය හිඟය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.4 කට සීමා කර ගැනීමට රජය සමත් විය.

වර්තන ගිණුමේ හිඟය සහ සමස්ත අයවැය හිඟය යන දෙකම ඉකුත් වසරේ පිළිවෙලින් සියයට 2.9 ක් හා සියයට 10 ක් වූ හිඟයන්ට වඩා අඩු මට්ටමක පැවතුනද මෙහි ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා පහත් මට්ටමක පැවතුණි. ඉහළ දේශීය ණය හා ආරක්ෂක වියදම් රටෙහි රාජ්‍ය මූල්‍ය කටයුතු මත පනවන බලපෑම අවධාරණය කරමින් ප්‍රාථමික හිඟය (පොලී ගෙවීම් අඩු කළ පසු හිඟය) 1994 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.4 සිට 1995 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.6 දක්වා පහත වැටුනු අතර, ආරක්ෂක වියදම් අත්හල පසු හිඟය, සියයට 5.4 සිට සියයට 3.2 දක්වා පහත වැටීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණයන්ගෙන් ලැබීම් අත්හල පසු හිඟය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.5 සිට සියයට 8.9 දක්වා පහත



රූප සටහන 8.1
රාජ්‍ය මූල්‍ය දර්ශක

වැටිණි.

විදේශීය ප්‍රදානයන් සහ සහනදායී ආධාර උපයෝජනය, 1994 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.4 සිට 1995 දී සියයට 3.3 දක්වා පහත වැටුණු අතර අයවැය හිඟය මූල්‍යකරණය සඳහා ශුද්ධ දේශීය මූලයන්ගෙන් ණය ගැනීම් 1994 දී සියයට 6.5 සිට 1995 දී සියයට 5.1 දක්වා පහත වැටිණ. කෙසේ වුවද, බැංකු අංශයෙන් ලබාගත් ණය රුපියල් දශලක්ෂ 7,405 කින් අඩු කිරීම සඳහා පැවති අරමුණ ලඟා කර ගැනීමට නොහැකි විය. ඒ වෙනුවට බැංකු අංශයෙන් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,065 කින් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1 කින් ඉහළ ගියේය. රජයට අවශ්‍ය වූ දේශීය සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් බැංකු නොවන වෙළෙඳ පළ ණය ගැනීම් වලින් ලබා ගන්නා ලදී. ගෙවුම් ශේෂයේ හිඟයක් පැවතීම හා පුද්ගලික අංශයෙන් ණය සඳහා තිරසාර ලෙස ඇති වූ ඉල්ලුම, 1995 වසර අවසානයේදී, ද්‍රවශීලතා හිඟයක් ඇති වීමටත් භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතයන් හා වෙනත් පොලී අනුපාතයන් තියුණු ලෙස ඉහළ නැගීමටත් හේතු විය. මේ තත්ත්වය යටතේ භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුවට අලෙවි කිරීම මගින් බැංකු අංශයෙන් සම්පත් ඒකරාශි කර ගැනීමට රජයට සිදුවිය. මේ නිසා අයවැය කටයුතු මගින්, වර්ෂය මුළුල්ලේම ඉහළ මට්ටමක පැවතුන මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

## 8.3 ආදායම සහ දීමනා

1995 වර්ෂයෙහි රාජ්‍ය ආදායම රුපියල් දශලක්ෂ 136,258 ක් වූ අතර පසුගිය වර්ෂයෙහි වූ සියයට 12 ක වර්ධනය හා සසඳන විට එය සියයට 24 ක වර්ධනයක් වාර්තා කළේය. මුළු බදු ආදායම සියයට 19 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 118,543 ක් වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1994 වර්ෂයේ වූ සියයට 17.2 සිට සියයට 17.9 දක්වා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ආනයන මත පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, සුරාබදු, ආනයන තීරුබදු සහ ආදායම් බදු වැනි සියළුම ප්‍රධාන බදු මූලයන් බදු ආදායමේ තිරසාර ශක්තිමත් වර්ධනයක් සඳහා දායක විය. එසේම තෝරාගත් වාණිජ ව්‍යාපාර සඳහා පනවන ලද විශේෂ බදු නිසා බදු නොවන ආදායම්හිද සියයට 67 ක කැපී පෙනුණු වර්ධනයක් ඇතිවිය.

### බදු ආදායම

ආදායම් සංයුතිය තුල, ආරක්ෂක බදු, සුරාබදු සහ පිරිවැටුම් බදු වැනි දේශීය භාණ්ඩ හා සේවා සඳහා අය කරනු ලබන බදු මත රඳ පැවැත්මෙහි වැඩිවීම විද්‍යාමාන කරමින් මුළු ආදායමින් භාණ්ඩ හා සේවා මත පැනවූ බදු ආදායමට හිමි කොටස 1994 වසරේදී සියයට 57 සිට 1995 දී සියයට 60 දක්වා වැඩි විය. පසුගිය වසරේ සියයට 18 ක් වූ මෙම ආදායම් මූලයෙහි වැඩිවීම හා සසඳන කල මෙම වසරේදී සියයට 25 ක තියුණු වර්ධනයක් වාර්තා කරමින් එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.7 ක් විය.

අපනයන මත සහ තෝරාගත් සේවා කිහිපයක් හැර අනෙකුත් සියළු භාණ්ඩ හා සේවා මත පනවන ලද ආරක්ෂක බදු මගින් ලද ඉපැයීම සියයට 49 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 14,408 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 ක් විය. මෙම කැපී පෙනුණු වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ සියයට 3.5 ක් වූ ආරක්ෂක බද්ද සියයට 4.5 දක්වා 1995 ජූනි මස සිට වැඩි කිරීමත් ආනයන මත ආරක්ෂක බද්ද අය කිරීමේදී මෙතෙක් අනුගමනය කරන ලද පිළිවෙල වූ ණයවර ලිපි විවෘත කිරීමේදී බැංකු මගින් එය අය කිරීම වෙනුවට රේගුවෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී අය කිරීමත්ය.

**සංඛ්‍යා සටහන 8.1**
**රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය**

රුපියල් දශලක්ෂ

| | 1991 | 1992 | 1993 | 1994 | 1995 අනුමත ඇස්තමේන්තු | 1995 තාවකාලික | 1996 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම් සහ දීමනා | 84,049 | 94,061 | 106,364 | 118,295 | 146,040 | 145,286 | 157,207 |
| මුළු ආදායම | 76,179 | 85,781 | 98,339 | 110,038 | 137,110 | 136,258 | 148,207 |
| බදු ආදායම | 68,157 | 76,353 | 85,891 | 99,417 | 121,324 | 118,543 | 132,645 |
| බදු නොවන ආදායම | 8,022 | 9,428 | 12,448 | 10,621 | 15,786 | 17,715 | 15,562 |
| දීමනා | 7,870 | 8,280 | 8,025 | 8,257 | 8,930 | 9,028 | 9,000 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම | 119,527 | 116,973 | 140,460 | 167,769 | 186,595 | 191,568 | 208,485 |
| වර්තන | 83,756 | 89,639 | 102,288 | 127,085 | 133,424 | 146,061 | 169,781 |
| ප්‍රාග්ධනය | 25,304 | 24,948 | 33,662 | 30,391 | 42,668 | 40,907 | 43,203 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම | 10,467 | 2,386 | 4,510 | 10,293 | 10,503 | 4,600 | -4,499 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+) / හිගය (-) | -7,577 | -3,858 | -3,949 | -17,047 | 3,686 | -9,803 | -21,574 |
| අයවැය හිගය (දීමනාවලට පෙර) | -43,348 | -31,192 | -42,121 | -57,731 | -49,485 | -55,310 | -60,278 |
| අයවැය හිගය (දීමනාවලට පසු) | -35,478 | -22,912 | -34,096 | -49,474 | -40,555 | -46,282 | -51,278 |
| පියවීම් | 35,478 | 22,913 | 34,096 | 49,474 | 40,555 | 46,282 | 51,279 |
| විදේශීය ණය ගැනීම් | 19,329 | 7,361 | 9,855 | 11,778 | 18,382 | 12,310 | 19,078 |
| දේශීය ණය ගැනීම් | 16,149 | 15,552 | 24,241 | 37,696 | 22,173 | 33,972 | 32,201 |
| වෙළඳ පොළ - නොවන | 691 | -3,205 | 2,012 | -666 | - | 548 | - |
| වෙළඳ පොළ | 15,458 | 18,757 | 22,229 | 38,362 | 22,173 | 33,424 | 32,201 |
| බැංකු - නොවන | 15,423 | 21,079 | 28,308 | 37,205 | 29,578 | 26,359 | 32,201 |
| බැංකු | 35 | -2,322 | -6,079 | 1,157 | -7,405 | 7,065 | - |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | |
| මුළු ආදායම් සහ දීමනා | 22.6 | 22.1 | 21.4 | 20.4 | 22.1 | 21.9 | 20.3 |
| මුළු ආදායම | 20.4 | 20.2 | 19.7 | 19.0 | 20.8 | 20.6 | 19.1 |
| බදු ආදායම | 18.3 | 17.9 | 17.2 | 17.2 | 18.4 | 17.9 | 17.1 |
| බදු නොවන ආදායම | 2.2 | 2.2 | 2.5 | 1.8 | 2.4 | 2.7 | 2.0 |
| දීමනා | 2.1 | 1.9 | 1.6 | 1.4 | 1.4 | 1.4 | 1.2 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම් | 32.1 | 27.5 | 28.1 | 29.0 | 28.3 | 28.9 | 26.9 |
| වර්තන | 22.5 | 21.1 | 20.5 | 21.9 | 20.2 | 22.1 | 21.9 |
| ප්‍රාග්ධන | 6.8 | 5.9 | 6.7 | 5.2 | 6.5 | 6.2 | 5.6 |
| ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම | 2.8 | 0.6 | 0.9 | 1.8 | 1.6 | 0.7 | -0.6 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+)/ හිගය (-) | -2.0 | -0.9 | -0.8 | -2.9 | 0.6 | -1.5 | -2.8 |
| අයවැය හිගය (දීමනා වලට පෙර) | -11.6 | -7.3 | -8.4 | -10.0 | -7.5 | -8.4 | -7.8 |
| අයවැය හිගය (දීමනා වලට පසු) | -9.5 | -5.4 | -6.8 | -8.5 | -6.1 | -7.0 | -6.6 |
| පියවීම | 9.5 | 5.4 | 6.8 | 8.5 | 6.1 | 7.0 | 6.6 |
| විදේශීය ණය ගැනීම් | 5.2 | 1.7 | 2.0 | 2.0 | 2.8 | 1.9 | 2.5 |
| දේශීය ණය ගැනීම් | 4.3 | 3.7 | 4.9 | 6.5 | 3.4 | 5.1 | 4.2 |
| වෙළඳ පොළ - නොවන | 0.2 | -0.8 | 0.4 | -0.1 | - | 0.1 | - |
| වෙළඳ පොළ | 4.1 | 4.4 | 4.4 | 6.6 | 3.4 | 5.0 | 4.2 |
| බැංකු - නොවන | 4.1 | 5.0 | 5.7 | 6.4 | 4.5 | 4.0 | 4.2 |
| බැංකු | ... | -0.5 | -1.2 | 0.2 | -1.1 | 1.1 | - |

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

පිරිවැටුම් මත බදු ආදායම 1995 දී රුපියල් දශලක්ෂ 36,429 ක්ව සියයට 13 ක වැඩිවීමක් වාර්තා කල අතර මෙම වර්ධනයට ප්‍රබල ලෙස හේතු වූයේ අපනයන මත පිරිවැටුම් බදුවල පැවති ශක්තිමත් ආදායම් වර්ධනය හා පිරිවැටුම් බදු සඳහා අවම බදු කාණ්ඩය සියයට 5 සිට සියයට 6 දක්වා වැඩි කිරීමයි. තිරුබදු අය කෙරෙන ආනයන ප්‍රමාණයන්හි මන්දගාමී වර්ධනය මෙන්ම තිරු බද්දෙහිද අඩුවීමක් පවතිද්දීත්, පසුගිය වර්ෂයේ සියයට 7 ක වර්ධනය හා සසඳන කල ආනයන මත පිරිවැටුම් බදු 1995 දී රුපියල් දශලක්ෂ 19,449 ක් වී සියයට 17 ක වර්ධනයක් වාර්තා කලේය. මෙම තත්ත්වය කෙරෙහි 1995 පෙබරවාරියේදී සිදු කරන ලද බදු ඉවත් කිරීම් සහ අන්හැරීම් යථාර්තවාදී කිරීම විශාල වශයෙන් හේතු විය. 1994 හා සසඳන කළ සියයට 1 ක පහත වැටීමක් පෙන්නුම් කරන ලද නිෂ්පාදන මත පිරිවැටුම් බදු ආදායම මෙම වසරේදී සියයට 8 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 9,906 ක් විය. නිෂ්පාදන නොවන අංශයෙන් අය කර ගන්නා ලද පිරිවැටුම් බදු ප්‍රමාණය පෙර වර්ෂයෙහි පැවති සියයට 34 ක වර්ධනය හා සසඳන කල සියයට 10 ක වැඩි වීමක් පෙන්වමින් රුපියල් දශලක්ෂ 7,074 ක් විය.

නිෂ්පාදන බදු ඉපැයීම සියයට 33 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 19,436 ක් විය. එය බදු ආදායමින් සියයට 16 කි. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව එය 1994 පැවති සියයට 2.5 සිට 1995 දී සියයට 2.9 දක්වා ඉහළ නැගීමකි. මත්පැන් නිෂ්පාදනය සියයට 9 කින් ඉහළ යාමත්, 1995 ජනවාරියේ දී සිදු කරන ලද සංශෝධනයන් මගින් අරක්කු සම්මත ලීටරයක් රුපියල් 17.80 කින්ද දේශීය

වශයෙන් නිපදවන විදේශීය වර්ගයේ මත්පැන් සම්මත ලීටරයක් රුපියල් 25.90 කින් ද ඉහළ දැමීම පිළිබිඹු කරමින් මත්පැන් මත වූ සුරාබදු සියයට 34 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 6,298 ක් විය. දුම්කොළ සහ සිගරට් නිෂ්පාදනය සියයට 3 කින් වැඩිවීම සහ සිගරට් මත පැනවූ සුරාබදු වැඩි කිරීම හේතුකොටගෙන සැකසූ දුම්කොළ මත සහ සිගරට් මත වූ සුරාබදු සියයට 11 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 8,788 ක් විය. පෙට්‍රල් මත නිෂ්පාදන බදු වැඩිකිරීම (ලීටරයකට රුපියල් 2 සිට රුපියල් 7 දක්වා), ඩීසල් ලීටරයකට රුපියලක බද්දක් පැනවීම සහ තෝරාගත් කල් පවතින පාරිභෝගික භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු අනුපාත 1995 පෙබරවාරියේදී වැඩිකිරීම නිසාද, නිෂ්පාදන බදු ආදායම රුපියල් දශලක්ෂ 2,292 සිට රුපියල් දශලක්ෂ 4,350 දක්වා 1995 වර්ෂයේදී වැඩි විය. 1995 නොවැම්බර් මාසයේදී ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමයට අනුව තවදුරටත් නිෂ්පාදන බදු යථාර්තවාදී කරනු පිණිස සකස් කළ දුම්කොළ මත සහ සිගරට් මත වෙන වෙනම පනවා තිබූ නිෂ්පාදන බදු ඒකාබද්ධ කර එක් නිෂ්පාදන බද්දක් සිගරට් මත පනවන ලදී.


උපරිම තීරුබදු සීමාව සියයට 45 සිට සියයට 35 දක්වා අඩු කිරීම, පරිප්පු, කරවල වැනි අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්හි තීරුබදු නිදහස් කිරීම, කිරිපිටි, සීනි, සිමෙන්ති, රෙදි වියීම සඳහා භාවිතා කරන නූල් ආදියෙහි පවත්නා සහනදායී තීරුබදු තවදුරටත් පවත්වාගෙන යාම සහ ආනයන පරිමාවෙහි සුළු වර්ධනයක් පැවති තත්ත්වයක් තුල වුව ද ආනයන තීරුබදු සියයට 8 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 24,365 වශයෙන් වාර්තා විය. එහෙත් දළ ජාතික නිෂ්පාදනයෙහි අනුපාතයක් වශයෙන් එය 1994 වූ සියයට 3.9 සිට 1995 දී සියයට 3.7 දක්වා පහත වැටිණි. තවද ආනයන මත තීරුබදු යථාර්තවාදී කරනු වස් තීරුබදු පදනම 10, 20 සහ 35 වශයෙන් කාණ්ඩ 3 කට යටත් කරන ලදී. කෙසේ වුව ද සමාජයීය හා සමානාත්මතා කරුණු සැලකිල්ලට ගෙන මත්පැන්, දුම්කොළ, පුද්ගලික මෝටර් රථ සහ තෝරාගත් සුඛෝපභෝගී භාණ්ඩ මෙම සංශෝධනයෙන් ඉවත් කරන ලදී. ආනයන තීරුබදු ප්‍රතිසංස්කරණයෙ හි ප්‍රතිඵලයක් ලෙස පෙර දී සියයට 35-45 අතර වූ ඉහළ කාණ්ඩයට යටත් වූ රෙදිපිළි, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, මගී ප්‍රවාහනය සඳහා වූ වාහන, බයිසිකල්, මෝටර් රථ අමතර කොටස් ආදී විශාල පරාසයක වූ වෙළඳ භාණ්ඩ රාශියක තීරුබදු සියයට 20-35 අතර වූ අඩු තීරුබදු කාණ්ඩයක් යටතට වර්ගීකරණය කරනු ලැබිය.

බදු ආදායමින් සියයට 14 කට දායක වූ පුද්ගල සහ සාමූහික ආදායම් බදු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17,161 ක් විය. ආදායම් බදු දළ දේශීය නිෂ්පාදිත අනුපාතය පසුගිය වසරේ වූ සියයට 2.6 ප්‍රමාණයෙහි ම නොවෙනස්ව පැවතුනි. 1994 දී පුද්ගල ආදායම් බදු සඳහා බදු නිදහස් සීමාව වූ රුපියල් 42,000 හා වැටුප් ආදායම මත බදු බැර ප්‍රමාණය වූ රුපියල් 6,000 වෙනුවට 1995 වර්ෂයේදී ආදායම් බදු සීමාව සහ බදු බැර පිළිවෙලින් රුපියල් 60,000 සහ රුපියල් 15,700 වශයෙන් වැඩි කර තිබියදීත් 1995 වර්ෂයේ පුද්ගල ආදායම් බදු එකතුව රුපියල් දශලක්ෂ 7,358 ක් වෙමින් සියයට 31 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. එසේම සාමූහික ආදායම් බදු ද සුළු වශයෙන් සියයට 2 ක වැඩිවීමක් පෙන්වමින් රුපියල් දශලක්ෂ 9,803 ක් විය.

1995 දී සියයට 18 කින් වැඩි වූ මුද්දර බදු ආදායම රුපියල් දශලක්ෂ 5,162 ක් විය. මුද්දර බද්ද ශක්තිමත් ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත් කිරීමේ අරමුණින් වටිනාකම් හුවමාරුවේදී ඒවායෙහි අගය මත විචලනාත්මක ආදායම්

**රූප සටහන 8.2**

**ආදායම් සංයුතිය - 1990 සහ 1995**




ප්‍රමාණයක් එකතු කෙරෙන ආකාරයට මුද්දර බදු 1995 නොවැම්බර් මාසයේදී සංශෝධනය කරන ලදී. එසේම මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් මත අය කරනු ලබන බදු මගින් රුපියල් දශලක්ෂ 1,050 ක් උපයනු ලැබිණි. මේ අතර 1994 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 60 ක් වූ බලපත්‍ර ගාස්තු 1995 දී රුපියල් දශලක්ෂ 524 දක්වා වැඩි වූ අතර ඉන් රුපියල් දශලක්ෂ 167 කට දායක වූයේ 1995 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි 1995 සැප්තැම්බර් මස සිට අය කරනු ලැබූ සුඛෝපභෝගී වාහන සහ ඩීසල් මෝටර් රථ බදුය. එහෙයින් අයවැය ලේඛණයෙහි ආදායම ඇස්තමේන්තුගත කිරීමේදී මේ ආදායම් මාර්ගයෙන් අපේක්ෂා කල සමස්ථ ප්‍රතිඵලය අත්කර ගැනීමට නොහැකි විය. මෙම මෝටර් රථ මත පැනවූ නව බද්ද යටතේ සියළුම සුඛෝපභෝගී වාහන මත රුපියල් 25,000-50,000 වාර්ෂික බද්දක් සහ පොදු මගී ප්‍රවාහන රථ, ලොරි සහ ගොවිපළ වාහන හැර අනෙකුත් සියළුම ඩීසල් වාහන සඳහා වන පරිදි රුපියල් 5,000-10,000 ක වාර්ෂික ඩීසල් බද්දක් ද පනවන ලදී.

## සංඛ්‍යා සටහන 8.2
## රාජ්‍ය ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 අනුමත ඇස්තමේන්තු | 1995 තාවකාලික- | 1996 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **68,157** | **76,353** | **85,891** | **99,417** | **121,324** | **118,543** | **132,645** |
| ආදායම් බදු | 9,722 | 10,967 | 12,543 | 15,277 | 15,420 | 17,161 | 17,299 |
| පෞද්ගලික | 3,539 | 4,067 | 5,235 | 5,621 | 5,270 | 7,358 | 5,537 |
| සාමූහික | 6,183 | 6,900 | 7,308 | 9,656 | 10,150 | 9,803 | 11,762 |
| දේපල මත බදු | 3,541 | 3,597 | 3,493 | 4,386 | 4,667 | 5,162 | 5,839 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 3,033 | 1,991 | 1,073 | 471 | - | 1,050 | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 32,107 | 38,158 | 47,963 | 56,685 | 72,495 | 70,797 | 80,807 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 21,430 | 24,095 | 29,663 | 32,300 | 39,005 | 36,429 | 40,695 |
| නිෂ්පාදන | 7,945 | 8,262 | 9,231 | 9171 | 11,380 | 9,906 | 9,699 |
| නිෂ්පාදන නොවන | 2,974 | 3,546 | 4,825 | 6,445 | 8,180 | 7,074 | 8,772 |
| ආනයන | 10,511 | 12,287 | 15,607 | 16,684 | 19,445 | 19,449 | 22,224 |
| සුරාබදු | 10,597 | 10,232 | 11,655 | 14,632 | 20,339 | 19,436 | 21,775 |
| මත්පැන් | 3,126 | 3,434 | 4,063 | 4,686 | 5,410 | 6,298 | 5,950 |
| දුම්කොළ | 6,884 | 5,573 | 6,866 | 7,888 | 10,232 | 8,788 | 11,195 |
| වෙනත් | 587 | 1,225 | 726 | 2,058 | 4,697 | 4,350 | 4,630 |
| ආරක්ෂක බද්ද | | 3,764 | 6,589 | 9,693 | 10,887 | 14,408 | 16,090 |
| බලපත්‍ර ගාස්තු | 80 | 67 | 56 | 60 | 2,264 | 524 | 2,247 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 19,754 | 21,640 | 20,819 | 22,598 | 28,742 | 24,373 | 28,700 |
| ආනයන | 18,617 | 20,819 | 20,762 | 22,598 | 28,742 | 24,365 | 27,700 |
| අපනයන | 1,137 | 821 | 57 | - | - | 8 | - |
| තේ | 492 | 360 | 23 | - | - | - | - |
| ඉන් : වටිනාකම අනුව | 298 | 226 | - | - | - | - | - |
| රබර් | 476 | 318 | 16 | - | - | - | - |
| පොල් | 125 | 117 | 4 | - | - | - | - |
| අනෙකුත් අපනයන | 44 | 26 | 14 | - | - | 8 | - |
| **බදුනොවන ආදායම** | **8,022** | **9,428** | **12,448** | **10,621** | **15,786** | **17,715** | **15,562** |
| දේපල ආදායම | 5,964 | 6,262 | 8,154 | 7,360 | 10,140 | 12,856 | 10,082 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 500 | 1,150 | 1,000 | 1,200 | 1,200 | 1,200 | 1,200 |
| පොළී ආදායම | 2,617 | 3,596 | 4,390 | 4,560 | 5,635 | 6,946 | 6,006 |
| වෙළඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 2,612 | 1,179 | - | - | -482 | 0 | 0 |
| සේවා හා ගාස්තු | 917 | 1,225 | 1,303 | 988 | 2,613 | 1,751 | 2,650 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 1,141 | 1,941 | 2,991 | 2,273 | 3,033 | 3,108 | 2,830 |
| **මුළු ආදායම** | **76,179** | **85,781** | **98,339** | **110,038** | **137,110** | **136,258** | **148,207** |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 අනුමත ඇස්තමේන්තු | 1995 තාවකාලික- | 1996 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **18.3** | **17.9** | **17.2** | **17.2** | **18.4** | **17.9** | **17.1** |
| ආදායම් බදු | 2.6 | 2.6 | 2.5 | 2.6 | 2.3 | 2.6 | 2.2 |
| පෞද්ගලික | 0.9 | 1.0 | 1.0 | 1.0 | 0.8 | 1.1 | 0.7 |
| සාමූහික | 1.7 | 1.6 | 1.5 | 1.7 | 1.5 | 1.5 | 1.5 |
| දේපල මත බදු | 1.0 | 0.8 | 0.7 | 0.8 | 0.7 | 0.8 | 0.8 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 0.8 | 0.5 | 0.2 | 0.1 | - | 0.2 | - |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 8.6 | 9.0 | 9.6 | 9.8 | 11.0 | 10.7 | 10.4 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 5.8 | 5.7 | 5.9 | 5.6 | 5.9 | 5.5 | 5.2 |
| නිෂ්පාදන | 2.1 | 1.9 | 1.8 | 1.6 | 1.7 | 1.5 | 1.3 |
| නිෂ්පාදන නොවන | 0.8 | 0.8 | 1.0 | 1.1 | 1.2 | 1.1 | 1.1 |
| ආනයන | 2.8 | 2.9 | 3.1 | 2.9 | 2.9 | 2.9 | 2.9 |
| සුරාබදු | 2.8 | 2.4 | 2.3 | 2.5 | 3.1 | 2.9 | 2.8 |
| මත්පැන් | 0.8 | 0.8 | 0.8 | 0.8 | 0.8 | 1.0 | 0.8 |
| දුම්කොළ | 1.8 | 1.3 | 1.4 | 1.4 | 1.6 | 1.3 | 1.4 |
| වෙනත් | 0.2 | 0.3 | 0.1 | 0.4 | 0.7 | 0.7 | 0.6 |
| ආරක්ෂක බද්ද | - | 0.9 | 1.3 | 1.7 | 1.7 | 2.2 | 2.1 |
| බලපත්‍ර ගාස්තු | .... | .... | .... | ... | 0.3 | 0.1 | 0.3 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 5.3 | 5.1 | 4.2 | 3.9 | 4.4 | 3.7 | 3.7 |
| ආනයන | 5.0 | 4.9 | 4.2 | 3.9 | 4.4 | 3.7 | 3.7 |
| අපනයන | 0.3 | 0.2 | .... | - | - | - | - |
| තේ | 0.1 | 0.1 | .... | - | - | - | - |
| ඉන් වටිනාකම අනුව | 0.1 | 0.1 | - | - | - | - | - |
| රබර් | 0.1 | 0.1 | .... | - | - | - | - |
| පොල් | .... | .... | ... | - | - | - | - |
| අනෙකුත් අපනයන | .... | .... | .... | - | - | - | - |
| **බදු නොවන ආදායම** | **2.2** | **2.2** | **2.5** | **1.8** | **2.4** | **2.7** | **2.0** |
| දේපල ආදායම | 1.6 | 1.5 | 1.6 | 1.3 | 1.5 | 1.9 | 1.3 |
| ඉන් මහ බැංකුවේ ලාභ | 0.1 | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| පොළී ආදායම් | 0.7 | 0.8 | 0.7 | 0.8 | 0.9 | 1.0 | 0.8 |
| වෙළඳ ව්‍යවසායන්ගේ අතිරික්තය | 0.7 | 0.3 | - | - | -0.1 | - | - |
| සේවා ගාස්තු | 0.2 | 0.3 | 0.3 | 0.2 | 0.4 | 0.3 | 0.3 |
| අනෙකුත් බදු නොවන ආදායම් | 0.3 | 0.5 | 0.6 | 0.3 | 0.5 | 0.5 | 0.4 |
| **මුළු ආදායම** | **20.4** | **20.2** | **19.7** | **19.0** | **20.8** | **20.6** | **19.1** |

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

## බදු නොවන ආදායම්

බදු නොවන ආදායම් රුපියල් දශලක්ෂ 17,715 ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 67 ක වර්ධනයකි. බදු නොවන ආදායම 1995 වර්ෂයේ දී මුළු ආදායමින් සියයට 13 ක් විය. ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කරනු ලැබූ රුපියල් දශලක්ෂ 1,500 ක්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් අය කරන ලද රුපියල් දශලක්ෂ 1,000 ක් හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අය කරනු ලබන රුපියල් දශලක්ෂ 250 ක් වූ විශේෂ අයකිරීම්, 1995 වර්ෂයේදී බදු නොවන ආදායම් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට දායක විය. 1995 ජනවාරි සිට බලපවත්වන පරිදි රජයේ දෙපාර්තමේන්තු මගින් සපයන සේවා සඳහා අයකරන ගාස්තු හා අයකිරීම් සියයට 20 කින් වැඩිකිරීම පිළිබිඹු කෙරෙමින් 1994 වසරේදී ගාස්තු හා අයකිරීම් වලින් ලත් රුපියල් දශලක්ෂ 988 ක් වූ ආදායම 1995 වසරේදී රුපියල් දශලක්ෂ 1,751 දක්වා වැඩිවිය. 1995 නොවැම්බර්හිදී නේවාසික වීසා සහ ගමන් බලපත්‍ර ගාස්තු ඉහළ දමන ලදී. 1994 වර්ෂයේ දී පොලී ලැබීම් රුපියල් දශලක්ෂ 4,560 හා සසඳන කල 1995 වර්ෂයේ දී ලැබූ පොලී ආදායම රුපියල් දශලක්ෂ 6,946 ක් විය. අනෙකුත් උප ආදායම් ශීර්ෂ වන කුලී, දඩ හා රාජ්‍ය සන්තක කිරීම් යටතේ උපයා ගන්නා ලද ආදායම් පසුගිය වසරට වඩා සුළු වර්ධනයක් වාර්තා කළේය. දළ දේශීය නිෂ්පාදිතයට අනුව 1994 වසරේ දී සියයට 1.8 ක් වූ බදු නොවන ආදායම් 1995 වසරේදී සියයට 2.7 ක් දක්වා ඉහළ ගියේය

## විදේශ ප්‍රදානයන්

1995 වර්ෂයේදී අයවැය කටයුතු සඳහා උපයෝජනය කල විදේශ ප්‍රදානයන් සියයට 9 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 9,028 ක් විය. පසුගිය වසරේදී මෙන්ම, විදේශ ප්‍රදානයන් දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 1.4 ක මට්ටමෙහි ම පැවතිණි. ජපානය හා ඇමරිකා එක්සත් ජනපදය මුළු ප්‍රදානයන්ගෙන් සියයට 64 කට දායක වෙමින් ශ්‍රී ලංකාවට විශාලතම ආධාර සපයන්නන් ලෙස තවදුරටත් කටයුතු කරන ලදී. මුළු ප්‍රදානයන්ගෙන් රුපියල් දශලක්ෂ 5,980 ක් රාජ්‍ය ආයෝජන වැඩසටහන් සඳහා යොදා ගැණින.

## 8.4 වියදම


1995 දී රජයේ මුළු වියදම සහ ශුද්ධ ණය දීම් රුපියල් දශලක්ෂ 191,568 ක්ව, සියයට 14 ක වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවත්, රජයේ මුළු වියදම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1994 දි සියයට 29 සිට 1995 දී සියයට 28.9 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි. රුපියල් දශලක්ෂ 146,061 වූ වර්තන වියදම් රජයේ මුළු වියදමින් සියයට 76 ක් වූ අතර ඉතිරි සියයට 24 ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් විය. මේ අතර, ප්‍රාග්ධන වියදම් වලින් හා රජයේ අයවැයෙන් රාජ්‍ය ව්‍යවසායයන්ට ලබා දෙන ලද ණය වලින් සමන්විත වන රාජ්‍ය ආයෝජනය, 1995 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.9 ක් හෙවත් රුපියල් දශලක්ෂ 51,994 ක් විය.

## වර්තන වියදම්

1995 දී රජයේ වර්තන වියදම සියයට 15 ක වර්ධනයක් සහිතව රුපියල් දශලක්ෂ 146,061 ක් වූ අතර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1994 පැවති සියයට 22 සිට සුළු වර්ධනයක් දක්වමින් 1995 දී සියයට 22.1 ක් විය.

රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් සකස් කිරීම්වලට කෙටි කාලීනව බලපාන දැඩි සංරෝධකයන් රජයේ වර්තන වියදම් වලින් පිළිබිඹු විය. රජයේ සේවකයන්ට ගෙවන ලද පඩිනඩි සහ විශ්‍රාම වැටුප් රජයේ වර්තන වියදමින් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් හා රජයේ ආදායමින් සියයට 38 කට ආසන්න ප්‍රමාණයක් අවශෝෂණය කර ගන්නා ලදී. මෑත වර්ෂ වල දී පැවති ඉහළ අයවැය හිඟයන් හේතුකොට, රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 දක්වා ඉහළ නැගුණ අතර පොලී ගෙවීම් වර්තන වියදම් වලින් හතරෙන් එකකට හා රජයේ ආදායමින් සියයට 28 කට ආසන්න ප්‍රමාණයක් විය. රජයේ සේවකයන් ගේ වැටුප් හා දීමනා, විශ්‍රාම වැටුප් සහ රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම් වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුවී ඇති තත්ත්වයක් යටතේ අඩු අයවැය හිඟයක් සඳහා කරනු ලබන රාජ්‍ය මූල්‍ය ගැලපුම්වල පීඩනය රජයේ වත්කම් නඩත්තුව හා රාජ්‍ය ආයෝජන වැනි වැදගත් රාජ්‍ය වියදම් වැඩ සටහන් මත පැටවිණ. මීට අමතරව, රජයේ ආදායම් එක්රැස් කිරීමේ ප්‍රයත්නයද ඉහළ මට්ටමක පවත්වා ගැනීම අවශ්‍ය විය.

රූප සටහන 8.3
වියදම් සංයුතිය - 1990 සහ 1995



## සංඛ්‍යා සටහන 8.3
## ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ශුද්ධ ණයදීම

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 අනුමත ඇස්තමේන්තු | 1995 තාවකාලික- | 1996 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | **83,756** | **89,638** | **102,288** | **127,084** | **133,424** | **146,061** | **169,781** |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම | 35,848 | 39,692 | 44,895 | 54,700 | 55,223 | 67,348 | 82,521 |
| වැටුප් හා වේතන | 17,985 | 20,793 | 26,332 | 29,309 | 32,900 | 36,946 | 39,978 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 17,863 | 18,898 | 18,563 | 25,391 | 22,323 | 31,002 | 42,543 |
| පොළී ගෙවීම් | 22,073 | 25,940 | 30,203 | 38,031 | 37,203 | 38,226 | 44,057 |
| විදේශීය | 4,113 | 4,739 | 5,102 | 5,511 | 6,361 | 6,162 | 7,351 |
| දේශීය | 17,960 | 21,201 | 25,101 | 32,520 | 30,842 | 32,064 | 36,706 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 25,835 | 24,007 | 27,190 | 34,353 | 41,480 | 40,487 | 48,103 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 1,743 | 1,428 | 1,571 | 2,634 | 7,793 | 7,841 | 6,308 |
| රාජ්‍ය ආයතනයන්ට | 1,405 | 1,649 | 2,031 | 1,976 | 2,343 | 2,182 | 2,739 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 1,050 | 1,111 | 896 | 1,307 | 1,250 | 1,157 | 1,512 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 21,637 | 19,819 | 22,335 | 28,263 | 30,093 | 29,307 | 37,545 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 4,023 | 4,466 | 4,580 | 4,654 | 4,750 | 3,343 | 1,081 |
| ජනසවිය / සමෘධි | 3,407 | 3,098 | 3,685 | 5,369 | 4,600 | 5,759 | 11,794 |
| විශ්‍රාම වැටුප් | 8,832 | 8,099 | 10,516 | 13,271 | 14,894 | 15,057 | 17,359 |
| පොහොර සහනාධාර | - | - | - | 630 | 1,500 | 1,345 | 1,500 |
| වෙනත් | 5,375 | 4,156 | 3,554 | 4,339 | 4,349 | 3,803 | 5,811 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | -482 | - | -4,900 |
| **ප්‍රාග්ධන වියදම** | **25,305** | **24,949** | **33,662** | **30,391** | **43,623** | **40,907** | **43,203** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 14,072 | 12,604 | 19,719 | 16,747 | 25,428 | 21,908 | 27,313 |
| ප්‍රාග්ධන පැවරුම් | 11,233 | 12,345 | 13,943 | 13,644 | 18,194 | 18,998 | 18,290 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 2,993 | 4,610 | 4,311 | 4,246 | 5,230 | 7,614(අ) | 5,123 |
| රාජ්‍ය ආයතනයන්ට | 6,990 | 6,663 | 8,551 | 8,433 | 11,803 | 10,446 | 12,119 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 950 | 1,028 | 1,036 | 914 | 1,112 | 921 | 1,000 |
| වෙනත් | 300 | 44 | 45 | 51 | 49 | 17 | 49 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම** | **10,467** | **2,386** | **4,510** | **10,293** | **10,503** | **4,601** | **-4,499** |
| අත්තිකාරම් ගිණුම් | 1,819 | -150 | 410 | 2,462 | 500 | -1,580 | 500 |
| ණය දීම | 7,286 | 6,246 | 6,265 | 10,064 | 13,761 | 11,087 | 15,313 |
| ප්‍රතිව්‍යුහකරණය පිරිවැය | 3,335 | 1,750 | 1,465 | 3,739 | 3,392 | 3,191 | 4,792 |
| පෞද්ගලීකරණ ලැබීම් | -841 | -2,850 | -1,200 | -2,996 | -4,500 | -3,001 | -21,000 |
| ණය ආපසු ගෙවීම් | -1,132 | -2,610 | -2,430 | -2,976 | -2,650 | -5,097(ආ) | -4,104 |
| **මුළු වියදම සහ ශුද්ධ ණයදීම** | **119,528** | **116,973** | **140,460** | **167,768** | **187,549** | **191,568** | **208,485** |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | | | | | | | |
| **වර්තන වියදම** | **22.5** | **21.1** | **20.5** | **22.0** | **20.2** | **22.1** | **21.9** |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම | 9.6 | 9.3 | 9.0 | 9.5 | 8.4 | 10.2 | 10.6 |
| වැටුප් හා වේතන | 4.8 | 4.9 | 5.3 | 5.1 | 5.0 | 5.5 | 5.2 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 4.8 | 4.4 | 3.7 | 4.4 | 3.4 | 4.7 | 5.5 |
| පොළී ගෙවීම් | 5.9 | 6.1 | 6.0 | 6.6 | 5.6 | 5.8 | 5.7 |
| විදේශීය | 1.1 | 1.1 | 1.0 | 1.0 | 1.0 | 0.9 | 0.9 |
| දේශීය | 4.8 | 5.0 | 5.0 | 5.6 | 4.7 | 4.8 | 4.7 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 6.9 | 5.6 | 5.4 | 5.9 | 6.3 | 6.1 | 6.2 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.5 | 0.3 | 0.3 | 0.5 | 1.2 | 1.2 | 0.8 |
| රාජ්‍ය ආයතනයන්ට | 0.4 | 0.4 | 0.4 | 0.3 | 0.4 | 0.3 | 0.4 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.3 | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 5.8 | 4.7 | 4.5 | 4.9 | 4.6 | 4.4 | 4.8 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 1.1 | 1.0 | 0.9 | 0.8 | 0.7 | 0.5 | 0.1 |
| ජනසවිය / සමෘධි | 0.9 | 0.7 | 0.7 | 0.9 | 0.7 | 0.9 | 1.5 |
| විශ්‍රාම වැටුප් | 2.4 | 1.9 | 2.1 | 2.3 | 2.3 | 2.3 | 2.2 |
| පොහොර සහනාධාර | - | - | - | 0.1 | 0.2 | 0.2 | 0.2 |
| වෙනත් | 1.4 | 1.0 | 0.8 | 0.8 | 0.7 | 0.6 | 0.7 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | -0.1 | - | -0.6 |
| **ප්‍රාග්ධන වියදම** | **6.8** | **5.9** | **6.7** | **5.3** | **6.6** | **6.2** | **5.6** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 3.8 | 3.0 | 3.9 | 2.9 | 3.9 | 3.3 | 3.5 |
| ප්‍රාග්ධන පැවරුම් | 3.0 | 2.9 | 2.8 | 2.4 | 2.8 | 2.9 | 2.4 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 0.8 | 1.1 | 0.9 | 0.7 | 0.8 | 1.2 | 0.7 |
| රාජ්‍ය ආයතනයන්ට | 1.9 | 1.6 | 1.7 | 1.5 | 1.8 | 1.6 | 1.6 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.1 |
| වෙනත් | 0.1 | - | - | - | - | - | - |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම** | **2.8** | **0.6** | **0.9** | **1.8** | **1.6** | **0.7** | **-0.6** |
| ඉන් අත්තිකාරම් ගිණුම් | 0.5 | .... | 0.1 | .... | | | |
| **මුළු වියදම සහ ශුද්ධ ණයදීම** | **32.1** | **27.5** | **28.1** | **29.0** | **28.4** | **28.9** | **26.9** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) භාණ්ඩාගාරයේ ගිණුම් පොත්වල නැව් සංස්ථාවේ නමින් ඇති රුපියල් දශලක්ෂ 2,395 ක්වූ ණය ශේෂය කපාහැරීම සඳහා කරන ලද සටහන ද ඇතුලත්වේ.

(ආ) නැව් සංස්ථාව විසින් රුපියල් දශලක්ෂ 2,395 ක ණය ආපසු ගෙවීම වෙනුවෙන් කළ සටහන ද ඇතුලක් වේ.

1994 වර්ෂය තුලදී අක්‍රමවත් වැටුප් වැඩිකිරීම්වල බලපෑම සහ 1995 දී නව වැටුප් පරිමාණ සහිතව ගුරු සේවය ස්ථාපනය කිරීම හේතුකොට අදාල වර්ෂය තුල රජයේ වේතන සඳහා වියදම රුපියල් දශලක්ෂ 36,346 ක් වූ අතර එය රුපියල් දශලක්ෂ 7,037 ක වැඩිවීමකි. ගුරු සේවය සඳහා නව වැටුප් පරිමාණ ස්ථාපනය කිරීම නිසා ඇති වූ බලපෑම රුපියල් දශලක්ෂ 3,000 ක් පමණ වේ. තවද, තාවකාලික පදනමක් මත බඳවා ගත් රාජ්‍ය සේවක කාණ්ඩවල පැවති වැටුප් විෂමතා නිවැරදි කිරීම, අභ්‍යාසලාභී උපාධිධාරීන් 650 ක් අළුතින් බඳවා ගැනීම සහ 1994 වර්ෂයේදී රජයේ විවිධ දෙපාර්තමේන්තුවල අනියම් සේවකයන්ගේ රැකියා ස්ථිර කිරීම යන කරුණුද 1995 හි වේතන වියදම ඉහළ යාමට හේතු විය. 1995 දී වැටුප් හා වේතන සඳහා වූ වියදම වර්තන වියදමින් හතරෙන් එකකට දායක වෙමින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.5 ක පමණ මට්ටමෙහි පැවතිණ.

1995 දී සියයට 13 කින් ඉහළ ගිය විශ්‍රාම වැටුප්, රුපියල් දශලක්ෂ 15,057 ක් විය. විශ්‍රාමිකයන් සඳහා හිඟ හිටි රුපියල් 260 ක් වූ ජීවන වියදම් දීමනාව ලබා දීම මෙම වැඩි වීමෙන් කොටසකට හේතු විය. විශ්‍රාමිකයින් සංඛ්‍යාව ද 1994 වූ 330,000 සිට 1995 දී 342,000 දක්වා තවදුරටත් වර්ධනය විය.

විදුලිය, පණිවිඩ හුවමාරුව, ප්‍රවාහන කටයුතු, කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය දේ හා ආරක්ෂක අවශ්‍යතා යනාදි විවිධ භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා රජය විසින් දරන ලද වියදම 1994 ට වඩා සියයට 22 ක වර්ධනයක් සනිටුහන් කරමින් රුපියල් දශලක්ෂ 31,002 දක්වා වැඩිවිය. මෙම වියදම්වල වැඩිවීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ 1995 අප්‍රේල් මාසයේදී යුද්ධය නැවත ආරම්භවීමත් සමග ආරක්ෂක වියදම් ඉහළ නැගීමයි. රාජ්‍ය මූල්‍ය කටයුතු මත ආරක්ෂක වියදම් මගින් පැටවුන දැඩි පීඩනය පිළිබිඹු කරමින් මෙම කාණ්ඩයෙහි ඇතුලත් ආරක්ෂක කටයුතු සඳහා වූ වියදම් කොටස රුපියල් දශලක්ෂ 22,460 ක් හෙවත් සියයට 72 ක් විය. කෙසේ වුවත්, අනෙකුත් වර්තන වියදම් පාලනය කිරීම සඳහා ගන්නා ලද දැඩි පියවර හේතුකොට ආරක්ෂක නොවන වෙනත් භාණ්ඩ හා සේවා සඳහා කරන ලද වියදම් 1994 දී පැවති රුපියල් දශලක්ෂ 10,172 සිට 1995 දී රුපියල් දශලක්ෂ 8,542 දක්වා අඩුවිය.

රාජ්‍ය ණය සඳහා කරන ලද පොලී ගෙවීම් 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 38,226 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.8 ක් විය. දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් 1994 පැවති රුපියල් දශලක්ෂ 32,520 සිට 1995 දී රුපියල් දශලක්ෂ 32,064 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. 1993 වර්ෂයෙහි පැවති ඉහළ අනුපාතයන්ට ප්‍රතිවිරුද්ධ ලෙස 1994 හා 1995 වර්ෂයෙහි මුල් මාස හතර තුල භාණ්ඩාගාර බිල්පත් මත පොලී අනුපාත පහළ මට්ටමක පැවතීමෙහි පසු බලපෑම හේතුකොටගෙන භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොලී ගෙවීම් සියයට 25 කින් අඩුවිය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස 1994 ජූලි සහ 1995 ජූනි කාලසීමාව තුල කරන ලද රුපියල් දශලක්ෂ 40,168 ක්වූ විශාල ණය ගැනීම් ප්‍රමාණය පිළිබිඹු කරමින් රුපියල් ණය සඳහා කරන ලද පොලී ගෙවීම් 1994 පැවති රුපියල් දශලක්ෂ 13,808 සිට 1995 දී රුපියල් දශලක්ෂ 18,117 දක්වා ඉහළ නැගිණි. 1994 දී රුපියල් දශලක්ෂ 5,511 ක්වූ විදේශ ණය මත පොලී ගෙවීම් 1995 දී රුපියල් දශලක්ෂ 6,162 දක්වා වැඩිවිය. කෙසේ වුවත්. විදේශ ණයවල පැවති සහනදායි තත්ත්වය පිළිබිඹු කරමින් පෙර වර්ෂයේදී මෙන්ම 1995 දීද මෙම ණය සඳහා වූ සාමාන්‍ය පොලී අනුපාතය සියයට 1.8 ක් පමණ විය.

රාජ්‍ය සංස්ථා හා ආයතනවලට කරනු ලැබූ පැවරුම් රුපියල් දශලක්ෂ 4,610 සිට රුපියල් දශලක්ෂ 10,023 දක්වා ඉහළ නැගුණ අතර, පිටි සහනාධාරයෙහි වියදම පියවීම පිණිස සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) වෙත කරනු ලැබූ රුපියල් දශලක්ෂ 5,000 වූ ගෙවීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. පිටි සහනාධාරය සඳහා ඉහළ පිරිවැයක් ඇතිවීම, පිටි පරිභෝජනය වැඩිවීම සහ තිරුඟු සඳහා වූ සාමාන්‍ය මිල (මි.ගැ.මිල) මෙට්‍රික් ටොන් එකක් සඳහා 1994 පැවති මිල වූ ඇ.එ.ජ. ඩොලර් 136 සිට 1995 දී ඇ.එ.ජ. ඩොලර් 185 දක්වා තියුණු ලෙස ඉහළ නැගීමෙහි ප්‍රතිඵලයකි. තිරුඟු පිටි කිලෝ ග්‍රෑමයක පාලන මිල රුපියල් 6.65 සිට රුපියල් 11.15 දක්වා වැඩිවී තිබියදීත්, 1994 අගෝස්තු මාසයේදී කිලෝ ග්‍රෑමයකට ශත 22 ක්ව පැවති තිරිඟු පිටි සහනාධාරය 1995 දී තියුණු ලෙස ඉහළ නැගිණි. සාමාන්‍ය වශයෙන් ගත් කල වර්ෂය තුලදී තිරිඟු පිටි සහනාධාරය කිලෝ ග්‍රෑමයකට රුපියල් 9.02 ක් ව පැවතිණි. පිටි සඳහා වූ විශාල මිල සහනාධාරය පිළිබිඹු කරමින් මෙම වර්ෂය දෙක අතර ආහාර පාලකගේ දෙපාර්තමේන්තුව මගින් කරන ලද පිටි නිකුත් කිරීම සියයට 10 කින් වැඩි වූ අතර මුළු තිරිඟු ආනයනය සියයට 22 කින් වැඩි විය.

රජයේ දුම්රිය දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් අලාභ සඳහා කරන ලද පැවරුම් බොහෝ දුරට පෙර වර්ෂයෙහි පැවති මට්ටමෙහිම පැවතුන අතර 1995 වර්ෂය තුලදී තැපැල් ගාස්තු වැඩි කිරීම හේතුවෙන් තැපැල් දෙපාර්තුමේන්තුවෙහි අලාභය පෙර වර්ෂයට වඩා අඩු කර ගැනීමට හැකි විය. දුම්රිය ගාස්තු සංශෝධනය නොකිරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පිරිවැය නොකඩවා ඉහළ මට්ටමක පැවතිණි. ආහාර සහ භූමිතෙල් මුද්දර, ජනසවිය, සමෘද්ධි වැඩපිළිවෙල, පාසල් නිළ ඇඳුම්, දිවා ආහාර, වාර ප්‍රවේශ, පාසල් පොත්, ළදරු කිරිපිටි සහනාධාරය සහ ත්‍රිපෝෂ වැනි බහුවිධ වැඩසටහන් සඳහා කරන ලද සුභසාධන වියදම රුපියල් දශලක්ෂ 10,580 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.6 ක් විය. උතුරු හා නැගෙනහිර පළාත්වල යුද්ධයේ බලපෑමට ලක් වූ පවුල් සඳහා හදිසි සහන සැලසීම හා අවතැන්වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම රුපියල් දශලක්ෂ 2,106 කි. 1994 ඔක්තෝබර් මාසයේදී හඳුන්වා දෙන ලද පොහොර සහනාධාරය සඳහා වියදම රුපියල් දශලක්ෂ 1,345 ක් විය. කෙසේ වුවත්, සමෘද්ධි වැඩසටහන හඳුන්වා දීමෙන් ජනසවිය, ආහාර හා භූමිතෙල් මුද්දර සහ පාසල් දිවා ආහාර යන ප්‍රධාන වැඩ සටහන් තුන ඒකාබද්ධ කරන ලදී.

කාර්යයන් අනුව කල වර්ගීකරණ පදනමට අනුව අධ්‍යාපනය, සෞඛ්‍ය, සුභසාධන සහ ප්‍රජා සේවා ආදී සමාජ සේවා කටයුතු සඳහා කරන ලද වියදම 1995 දී සියයට 21 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 57,648 ක් වී මුළු වර්තන පිරිවැයෙන් සියයට 40 කට ආසන්න ප්‍රමාණයකට දායක විය. එය දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස 1994 දී වූ සියයට 8.2 සිට 1995 දී සියයට 8.7 දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් 1995 දී කරන ලද ගුරු වැටුප් සංශෝධනය හේතුකොට අධ්‍යාපනය සඳහා දරන ලද වියදම පෙර වර්ෂයට වඩා සියයට 6 කින් වැඩි වූ අතර, 1994 වර්ෂයෙහි පැවති රුපියල් දශලක්ෂ 7,666 සමග සසඳන කල සෞඛ්‍ය සඳහා කල වියදම රුපියල් දශලක්ෂ 8,818 දක්වා වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය සහ වාරිමාර්ග, ධීවර,

### සංඛ්‍යා සටහන 8.4
### කාර්යයන් අනුව වියදමෙහි වර්ගීකරණය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 අනුමිත ඇස්තමේන්තු | 1995 තාවකාලික | 1996 අනුමිත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **19,811** | **24,453** | **27,564** | **30,444** | **31,049** | **39,986** | **48,400** |
| සිවිල් පරිපාලනය | 5,612 | 7,099 | 7,405 | 4,637 | 8,182 | 6,562 | 16,202 |
| ආරක්ෂක කටයුතු | 10,317 | 12,876 | 15,413 | 19,415 | 16,750 | 27,284 | 25,180 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 3,882 | 4,478 | 4,746 | 6,392 | 6,118 | 6,140 | 7,018 |
| සමාජ සේවා | **31,594** | **32,700** | **37,477** | **47,656** | **54,932** | **57,648** | **63,194** |
| අධ්‍යාපනය | 7,951 | 10,533 | 11,225 | 14,836 | 14,732 | 15,784 | 13,231 |
| සෞඛ්‍යය | 4,110 | 4,518 | 5,711 | 7,666 | 8,627 | 8,818 | 10,566 |
| ශුභ සාධන | 19,266 | 17,378 | 20,255 | 24,560 | 30,826 | 32,106 | 38,550 |
| නිවාස | - | - | - | - | - | - | - |
| ප්‍රජා සේවා | 267 | 271 | 285 | 593 | 747 | 941 | 847 |
| **ආර්ථික සේවා** | **3,925** | **3,834** | **4,328** | **6,195** | **7,241** | **8,078** | **8,169** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 912 | 1,398 | 1,483 | 2,506 | 2,968 | 3,826 | 3,448 |
| ධීවර | 98 | 68 | 107 | 99 | 133 | 105 | 178 |
| නිෂ්පාදන සහ කැනීම් | 231 | 349 | 403 | 351 | 651 | 252 | 702 |
| බලශක්ති සහ ජල සම්පාදන | 659 | 133 | 93 | 518 | 997 | 990 | 810 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 1,308 | 1,208 | 1,346 | 2,024 | 1,602 | 2,014 | 1,974 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 137 | 232 | 203 | 72 | 105 | 172 | 287 |
| වෙනත් | 560 | 446 | 693 | 625 | 785 | 719 | 771 |
| **අනෙකුත්** | **28,425** | **28,652** | **32,920** | **42,789** | **40,684** | **40,350** | **54,918** |
| ඉන් පොලී ගෙවීම් | 22,073 | 25,940 | 30,203 | 38,031 | 37,203 | 38,226 | 44,057 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | -482 | - | -4,900 |
| **මුළු වර්තන වියදම** | **83,756** | **89,639** | **102,288** | **127,084** | **133,424** | **146,061** | **169,781** |
| **ප්‍රාග්ධන වියදම සහ ණය දීම** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **2,422** | **1,970** | **4,085** | **2,390** | **5,006** | **5,096** | **4,335** |
| සිවිල් පරිපාලනය | 1,680 | 1,256 | 3,463 | 1,753 | 3,626 | 3,962 | 3,226 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 742 | 714 | 622 | 637 | 1,380 | 1,134 | 1,109 |
| **සමාජ සේවා** | **2,964** | **6,137** | **6,075** | **7,677** | **11,140** | **9,854** | **12,363** |
| අධ්‍යාපනය | 1,178 | 2,008 | 2,845 | 2,877 | 4,126 | 3,124 | 4,418 |
| සෞඛ්‍යය | 1,119 | 2,023 | 1,353 | 1,519 | 3,075 | 2,134 | 3,661 |
| ශුභසාධන | 15 | 1,191 | 1,084 | 1,681 | 289 | 1,690 | 1,145 |
| නිවාස | 535 | 767 | 604 | 802 | 2,099 | 1,610 | 1,256 |
| ප්‍රජා සේවා | 117 | 148 | 189 | 798 | 1,551 | 1,297 | 1,882 |
| **ආර්ථික සේවා** | **26,022** | **20,444** | **29,600** | **29,304** | **40,424** | **36,106** | **43,170** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 6,071 | 5,890 | 5,682 | 5,179 | 6,171 | 6,060 | 6,525 |
| ඉන් මහවැලි යෝජනා ක්‍රමය | 2,410 | 2,670 | 2,810 | 2,598 | 2,764 | 3,090 | 2,133 |
| ධීවර | 181 | 175 | 124 | 368 | 189 | 361 | 542 |
| නිෂ්පාදනය සහ කැනීම් | 171 | 184 | 1,471 | 22 | 273 | 250 | 1,019 |
| බලශක්ති සහ ජල සම්පාදනය | 6,181 | 5,527 | 4,728 | 5,518 | 7,884 | 5,003 | 6,914 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 10,921 | 4,363 | 10,165 | 14,522 | 18,639 | 18,888 | 19,696 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 218 | 365 | 364 | 182 | 427 | 20 | 353 |
| වෙනත් | 2,279 | 3,940 | 7,066 | 3,513 | 6,841 | 5,524 | 8,121 |
| **අනෙකුත්** | **1,250** | **1,072** | **1,081** | **1,084** | **1,161** | **939** | **1,049** |
| **මුළු ප්‍රාග්ධන වියදම හා ණයදීම** | **32,658** | **29,622** | **40,841** | **40,455** | **57,731** | **51,994** | **58,516** |

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන හා කැනීම්, බලශක්තිය හා ජල සම්පාදනය, ප්‍රවාහනය හා සන්නිවේදනය, වෙළඳම හා වාණිජ්‍යය යනාදි කටයුතුවල නියැලුනු රජයේ ආයතනවල මෙහෙයුම් පිරිවැය ඇතුළත් වූ ආර්ථික සේවා කටයුතු සඳහා කරන ලද වර්තන වියදම රුපියල් දශලක්ෂ 8,078 ක් වූ අතර එය 1994 වර්ෂයේ උපයෝජනය කරන ලද ප්‍රමාණයට වඩා සියයට 30 ක වැඩිවීමකි. මෙය ප්‍රධාන වශයෙන් පොහොර සහනාධාරය මුළු වර්ෂය තුලම ක්‍රියාත්මක වීම නිසා ඇති වූ බලපෑමෙහි ප්‍රතිඵලයකි.

සිවිල් පරිපාලනය හා ආරක්ෂක කටයුතු සඳහා කරන ලද වර්තන වියදම රුපියල් දශලක්ෂ 39,986 ක් වූ අතර පෙර වර්ෂය හා සසඳන කල සියයට 31 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. 1994 හි පැවති රුපියල් දශලක්ෂ 25,807 සිට 1995 දී රුපියල් දශලක්ෂ 33,424 දක්වා වැඩි වූ ආරක්ෂක කටයුතු හා සම්බන්ධ වියදම තුල මෙම වැඩිවීම මුළුමනින්ම පාහේ පිළිබිඹු වේ. මෙම පිරිවැය ප්‍රභවය පමණක් මුළු වර්තන වියදමින් පහෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 ක් වේ.

## රාජ්‍ය ආයෝජන

ප්‍රාග්ධන වියදම වන රුපියල් දශලක්ෂ 40,907 ක් හා රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය රුපියල් දශලක්ෂ 11,087 කින් සමන්විත වූ රාජ්‍ය ආයෝජනය රුපියල් දශලක්ෂ 51,994 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.9 ක් විය. රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ (රා.ආ.වැ.) ස්ථාවර වත්කම් ගොඩ නැගීම හා සංවර්ධනය කිරීම සඳහා අදාල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් සෘජුවම කරන ලද ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 1994 පැවති රුපියල් දශලක්ෂ 16,747 සමග සසඳන කල 1995 දී රුපියල් දශලක්ෂ 21,908 ක්ව පැවතිණි. රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් සිදු කරන ලද රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා රුපියල් දශලක්ෂ 29,147 ක් යොදා

ගන්නා ලද අතර එය පෙර වර්ෂයට වඩා සියයට 28 ක වැඩිවීමකි. මෙම අරමුදල් වලින් රුපියල් දශලක්ෂ 19,476 ක්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය (රුපියල් දශලක්ෂ 5,943), මාර්ග සංවර්ධන අධිකාරිය (රුපියල් දශලක්ෂ 4,927), ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (රුපියල් දශලක්ෂ 3,156), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (රුපියල් දශලක්ෂ 3,090) හා ශ්‍රී ලංකා ටෙලිකොම් (රුපියල් දශලක්ෂ 2,360) විසින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

රජයේ සංස්ථා සහ ආයතන විසින් රජයෙන් සපයන ලද ණය පහසුකම් මගින් සම්පත් රාශිකරණය කිරීමෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 11,087 වූ අතර එය 1995 වර්ෂයේදී වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය වූ රුපියල් දශලක්ෂ 13,761 ට වඩා පහත් මට්ටමක පැවතුණි. ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) විසින් ක්‍රියාත්මක කරන, මුළුමනින්ම විදේශ ආධාර වලින් අරමුදල් සපයන විදුලිබලය බෙදාහැරීම හා සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රුපියල් දශලක්ෂ 4,335 ක් වූ අය වැය ප්‍රතිපාදනයෙන් ප්‍රයෝජනයට ගනු ලැබුයේ රුපියල් දශලක්ෂ 1,482 ක් පමණකි. එලෙසම විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලැබූ රුපියල් දශලක්ෂ 3,501 න් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය උපයෝජනය කරනු ලැබුවේ රුපියල් දශලක්ෂ 2,360 ක් පමණි. මෙසේ ප්‍රතිපාදනයන්ට වඩා පහළ මට්ටමක උපයෝජනය පැවතීමට ප්‍රධාන හේතුව වූයේ ක්‍රියාත්මක කිරීමේ සහ ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රමාද වීමය. කෙසේ වුවත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය අයවැය ප්‍රතිපාදනය ඉක්මවන පරිදි රුපියල් දශලක්ෂ 5,943 ක් වරාය පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද අතර මින් විශාල කොටසක් විදේශ අරමුදල් වලින් මූල්‍යකරණය කරන ලදී

කාර්යයන් අනුව කළ වර්ගීකරණ පදනම යටතේ ආර්ථික සේවා සංවර්ධනය සඳහා යොදන ලද රාජ්‍ය ආයෝජනය රුපියල් දශලක්ෂ 36,106 ක් (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.5 ක්) විය. මෙම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 18,888 ක් හෙවත් සියයට 52 ක් ප්‍රවාහන හා සංනිවේදන කටයුතු සඳහා වැය කරනු ලැබිණි. මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා උපයෝජනය කරන ද රුපියල් දශලක්ෂ 4,927 ක් ද මෙයට ඇතුළත්ය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා ටෙලිකොම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 5,943 ක් සහ රුපියල් දශලක්ෂ 2,360 ක් ප්‍රයෝජනයට ගන්නා ලදී. කෘෂිකර්මාන්ත හා වාරිමාර්ග කටයුතු වෙනුවෙන් වැය කරන ලද රුපියල් දශලක්ෂ 6,060 ක මුදලින් සියයට 51 ප්‍රයෝජනයට ගන්නා ලද්දේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියයි. බලශක්තිය හා ජල සැපයුම සඳහා යොදන ලද රාජ්‍ය ආයෝජනය රුපියල් දශලක්ෂ 5,003 ක් වූ අතර එය මෙම අංශයන්හි සංවර්ධනය සඳහා ආරම්භයේදී වෙන් කරන ලද සම්පත් ප්‍රමාණයට වඩා සියයට 37 ක අඩුවීමකි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ ලංකා විදුලිබල මණ්ඩලයට රජයේ ණය වැඩ සටහන යටතේ වෙන් කරන ලද සම්පත්වල ඌණ උපයෝජන යයි. සමාජ සේවා කටයුතු වෙනුවෙන් කරනු ලැබූ ප්‍රාග්ධන පිරිවැය සියයට 28 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 9,854 ක් විය. සමාජ සේවා යටතට ගැනෙන අංශයන් පහෙන් හතරක් වන අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස හා ප්‍රජා සේවා සඳහා රාජ්‍ය ආයෝජනය සැලකිය යුතු ලෙස වැඩි විය. ආන්තික වැඩිවීමක් පමණක් වාර්තා කල එකම අංශය සුභසාධක සේවා අංශයයි. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සමාජ සේවා සඳහා කරන ලද රාජ්‍ය ආයෝජනය 1994 පැවති සියයට 1.3 සිට 1995 දී සියයට 1.5 දක්වා ඉහළ නැගිණි. රුපියල් දශලක්ෂ 5,096 ක් වූ සිවිල් පරිපාලනය සඳහා කරන ලද ප්‍රාග්ධන ආයෝජනය දශලක්ෂ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.8 ක් නියෝජනය කරනු ලැබිය.

## 8.5 රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහනින් ජනිත ආදායම රුපියල් දශලක්ෂ 3,001 ක් විය. විදේශීය ප්‍රාග්ධනය සහ තාක්ෂණය ඇද ගැනීමට සමත් කොළඹ ගෑස් සමාගම වැනි මූලික වාණිජමය ව්‍යවසායයන් කිහිපයක් රජය විසින් සම්පූර්ණයෙන්ම පවරා දෙනු ලැබිය. මෙම ගනුදෙනුවෙන් උද්ගතවූ මුළු ආදායම ඇමරිකානු ඩොලර් දශලක්ෂ 37 ක් (රුපියල් දශලක්ෂ 1,998 ක්) විය. මීට අතිරේකව වර්ෂය තුළදී ප්‍රාග්ධන සංවර්ධන ආයෝජන සමාගම සහ වැවිලි සමාගම් කිහිපයකද පෞද්ගලික අංශයට පවරා දෙනු ලැබිණි. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම විසින් එයාර්ලංකා සමාගම, ශ්‍රී ලංකා ටෙලිකොම්, ඔරියන්ට් ලංකා සමාගම, සෙවනගල සීනි, ලංකා විදුලිබල සමාගම සහ තවත් කුඩා ව්‍යවසායයන් කිහිපයක් ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අරඹනු ලැබිය. රජය විසින් කලින් දෙන ලද ණය වලින් අය කරගත් මුළු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 5,097 ක් විය. ඉන් රුපියල් දශලක්ෂ 1,420 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවා දමන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ රාජ්‍ය බැංකු දෙක විසින් දරණු ලබන රජයේ බැඳුම්කර මත ගෙවන ලද වාර්ෂික පොලී ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,891 ක් විය.


## 8.6 අයවැය හිඟය පියවීම

1995 වර්ෂයෙහි අයවැය හිඟය (ප්‍රදානයන්ට පසුව) රුපියල් දශලක්ෂ 46,282 ක් වූ අතර එය 1994 වර්ෂයේ පැවති හිඟයට වඩා සියයට 6 ක එනම් රුපියල් දශලක්ෂ 3,191 ක අඩුවීමක් පෙන්නුම් කරයි. දළ විදේශීය ණය ගැනීම් සියයට 7ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 20,787 ක් වුවද රුපියල් දශලක්ෂ 8,477 ක් වූ ණය ආපසු ගෙවීම් හේතුකොට ශුද්ධ විදේශ ණය ගැනීම් රුපියල් දශලක්ෂ 12,310 ක් විය. විදේශ අරමුදල් මගින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති, විශේෂයෙන්ම බලශක්ති හා විදුලි සංදේශ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පමාවීම හේතුවෙන් දළ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය අයවැය මගින් බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා සියයට 21 ක අඩුවීමක් පෙන්නුම් කළේය. 1995 දී ශුද්ධ විදේශ ණය ගැනීම් දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව සියයට 1.9 ක් ව පැවතුණි.

ඉකුත් වර්ෂයේ පැවති රුපියල් දශලක්ෂ 52,051 හා සසඳන කල අයවැය කටයුතු සඳහා බැංකු නොවන දේශීය අංශයන්ගෙන්, රුපියල් ණය, භාණ්ඩාගාර බිල්පත් හා පරිපාලන ණය යටතේ ලබාගත් දළ දේශීය ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 55,075 ක් විය. 1995 වර්ෂයේ රුපියල් ණය මගින් රජය ලබාගත් දළ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 46,715 ක් වූ අතර 1994 වර්ෂයේදී මෙම මූලාශ්‍රයෙන් ලබාගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 46,878 කි. කෙසේ වුව ද 1995 වර්ෂයේදී රුපියල් සුරැකුම් මත ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 26,329 ක් වීම හේතුවෙන් මෙම මූලාශ්‍රයෙන් 1994 වර්ෂයේ ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 20,386 ක් විය. මීට අනුරූප ලෙස 1994 වර්ෂයේ රුපියල් සුරැකුම්

මගින් කල ශුද්ධ ණය ගැනීම් රුපියල් දශලක්ෂ 31,922 කි.

පෙර වර්ෂයේදී මෙන් ම 1995 වසරේදීද සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) රුපියල් ණය වැඩසටහනෙහි ප්‍රධාන ආයෝජකයා බවට පත් විය. මෙමගින් රුපියල් ණය වැඩසටහනෙහි කරන ලද ආයෝජනය රුපියල් දශලක්ෂ 31,420 ක් වූ අතර එය සියයට 24 ක නැතහොත් රුපියල් දශලක්ෂ 6,068 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස රුපියල් ණය වැඩසටහන සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි (ජා.ඉ.බැ.) දායකත්වය 1994 පැවති රුපියල් දශලක්ෂ 19,595 ප්‍රමාණයේ සිට 1995 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 14,429 ක් දක්වා පහත වැටුණි. මීට බලපෑ හේතුව වූයේ ඉහළ ඵලදාවක් සහිත භාණ්ඩාගාර බිල්පත් වෙත නැඹුරු වීමයි. කෙසේ වෙතත්, 1995 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව රුපියල් ණය වැඩසටහනෙහි ආයෝජනයෙන් සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයකට දායක විය. 1995 වර්ෂයේදී රුපියල් ණය සඳහා වූ පොලී අනුපාතය සියයට 14 ක්ව නොවෙනස්ව පැවැති අතර එක් අවුරුදු කල්පිරීම් කාලසීමාවක් සහිත වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලී අනුපාතිකය සියයට 13.68 - 20.54 අතර පරාසයක උච්චාවචනය විය. අයවැය හිඟය පියවා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මගින් ප්‍රයෝජනයට ගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 9,755 ක් විය. තවදුරටත් රජය විසින් රුපියල් දශලක්ෂ 53 ක මුදලක් භාණ්ඩාගාර තැන්පතු සහතික මගින් (භා.තැ.ස.) ද රුපියල් දශලක්ෂ 548





ක් පරිපාලන ණය මගින් ද ලබා ගන්නා ලදී.

1994 වර්ෂයේදී වූ රුපියල් දශලක්ෂ 37,205 ක ණය හා සසඳන කල 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 28,069 ක ණය ආපසු ගෙවීමකින් පසු බැංකු නොවන අංශයන්ගෙන් ලබාගත් ශුද්ධ දේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 26,359 ක් විය. ඒ අනුව බැංකු නොවන අංශයන්ගෙන් වූ ශුද්ධ දේශීය මූල්‍යකරණය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව 1994 වර්ෂයේ වූ සියයට 6.3 සිට 1995 වන විට සියයට 4.1 දක්වා පහත වැටුණි. මෙසේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7 ක් වූ අයවැය හිඟයෙන් (ප්‍රදානයන්ට පසු) සියයට 1.9 ක් විදේශීය ණය වලින් ද සියයට 4.1 ක් බැංකු නොවන අංශයන්ගෙන් ද මූල්‍යකරණය කරන ලද අතර ශේෂය බැංකු අංශය මගින් මූල්‍යකරණය කිරීමට සිදුවිය. එහෙයින් 1994 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.2 ක් වූ බැංකු අංශයේ මූල්‍යකරණය 1995 වර්ෂයේදී සියයට 1.1 ක් දක්වා වැඩිවූයේ මුදල් සැපයුම කෙරෙහි පීඩනයක් ඇති කරමිනි.

භාණ්ඩාගර බිල්පත් මාර්ගයෙන් රුපියල් දශලක්ෂ 7,426 ක් ද, තාවකාලික අත්තිකාරම් මත රුපියල් දශලක්ෂ 1,334 ක් ද වශයෙන් රුපියල් දශලක්ෂ 8,760 ක දළ ණය ප්‍රමාණයක් රජය විසින් මහ බැංකුවෙන් ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති රජයේ මුදල් ශේෂය රුපියල් දශලක්ෂ 227 කින් වර්ධනය වීම හා එකතු කිරීමට ඇති මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 871 කින් අඩුවීමද සැළකිල්ලට ගත් කල ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රජය ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 7,662 ක් වූ අතර එමගින් ආර්ථිකයෙහි සංචිත මුදල් ප්‍රමාණයෙහි (අධිබලැති මුදල්) ප්‍රසාරණය වීමක් සිදුවිය. රජයේ ආනයන බිල්පත් (රුපියල් දශලක්ෂ 2,548 කින් ද) රජයට දෙන ලද බැංකු අයිරාවන් (රුපියල් දශලක්ෂ 379 කින්) සහ රැස්කිරීමට ඇති මුදල් ශේෂ (රුපියල් දශලක්ෂ 856 කින්) වැඩිවී තිබුණද වාණිජ බැංකු විසින් දරණ ලද භාණ්ඩාගාර බිල්පත් හා රජයේ සුරැකුම්පත් ප්‍රමාණය (රුපියල් දශලක්ෂ 4,186 කින්) පහත වැටීම සහ රජයේ තැන්පතු (රුපියල් දශලක්ෂ 194 කින්) වැඩිවීම හේතුකොට වාණිජ බැංකු විසින් රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 597 කින් පහත වැටුණි. මේ හේතුවෙන් 1995 වර්ෂය තුළදී සමස්ත රාජ්‍ය මූල්‍ය කටයුතු සඳහා රජය විසින් බැංකු ක්‍රමයෙන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,065 කින් ඉහළ නැගුණි.

## 8.7 රාජ්‍ය ණය

1995 වර්ෂය අවසානයේදී සියයට 15 කින් වැඩි වූ රජයේ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 631,593 ක් විය. ඒ අනුව, රාජ්‍ය ණය/දළ දේශීය නිෂ්පාදන අනුපාතය ඉකුත් වර්ෂයේ වූ සියයට 95 මට්ටමේම තවදුරටත් පැවතිණ. දේශීය ණය ප්‍රමාණය මුළු ණය ප්‍රමාණයෙන්, සියයට 45 ක් වූ අතර




විදේශීය ණය ප්‍රමාණය සියයට 55 ක් විය.

### දේශීය ණය

මුළු නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 45 ක් වූ දේශීය ණය ප්‍රමාණය, 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 285,759 ක් විය. මෙය සියයට 15 ක වැඩි වීමකි. 1994 දී දේශීය ණය ප්‍රමාණය ඊට පෙර වර්ෂයට වඩා සියයට 17 කින් වැඩිවිය. මුළු දේශීය ණය ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 127,471 ක් හෙවත් සියයට 45 ක්, වර්ෂයකදී හෝ ඊට අඩු කාලයක් තුළදී කල්පිරෙන කෙටිකාලීන ණය විය. 1994 වර්ෂයේදී පැවති සියයට 7 ක වර්ධන අනුපාතය හා සසඳන කල

## සංඛ්‍යා සටහන 8.5
## නොපියවූ රාජ්‍ය ණය (අ)

රුපියල් දශලක්ෂ

| | 1991 | 1992 | 1993 | 1994 | 1995 තාවකාලික |
|---|---|---|---|---|---|
| **මුළු දේශීය ණය** | **152,119** | **170,020** | **213,685** | **249,118** | **285,759** |
| කෙටි කාලීන | 84,412 | 97,924 | 101,845 | 108,725 | 127,471 |
| භාණ්ඩාගාර බිල්පත් | 72,968 | 84,996 | 91,343 | 96,360 | 113,771 |
| රුපියල් සුරැකුම්පත් | 4,000 | 4,000 | - | - | - |
| තාවකාලික අත්තිකාරම් | 7,444 | 8,928 | 10,502 | 12,366 | 13,700 |
| මැදි හා දිගුකාලීන | 67,707 | 72,096 | 111,840 | 140,393 | 158,289 |
| රුපියල් සුරැකුම්පත් (ආ) | 62,823 | 65,180 | 105,707 | 137,554 | 157,928 |
| භාණ්ඩාගාර බිල්පත් | - | 2,100 | 5,853 | 2,536 | - |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,532 | 4,532 | - | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 153 | 102 | 114 | 145 | 200 |
| බදු සංචිත සහතික පත්‍ර | 9 | 8 | 8 | 7 | 7 |
| වෙනත් | 190 | 174 | 158 | 151 | 153 |
| ණය උපකරණ අනුව | 152,120 | 170,020 | 213,685 | 249,118 | 285,759 |
| රුපියල් සුරැකුම්පත් | 66,823 | 69,180 | 105,707 | 137,554 | 157,928 |
| භාණ්ඩාගාර බිල්පත් | 72,968 | 87,096 | 97,196 | 98,896 | 113,771 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,532 | 4,532 | - | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 153 | 102 | 114 | 145 | 200 |
| බදු සංචිත සහතික පත්‍ර | 9 | 8 | 8 | 7 | 7 |
| තාවකාලික අත්තිකාරම් | 7,444 | 8,928 | 10,502 | 12,366 | 13,700 |
| වෙනත් | 191 | 174 | 158 | 151 | 153 |
| ආයතන අනුව | 152,120 | 170,020 | 213,684 | 249,119 | 285,760 |
| බැංකු | 52,145 | 58,111 | 90,134 | 100,043 | 113,355 |
| මහ බැංකුව | | | | | |
| ණය උපකරණ අනුව | 42,486 | 34,932 | 16,480 | 21,345 | 28,684 |
| රුපියල් ණය | 10 | 6 | - | - | - |
| භාණ්ඩාගාර බිල්පත් | 35,032 | 25,998 | 5,978 | 8,979 | 14,984 |
| තාවකාලික අත්තිකාරම් | 7,444 | 8,928 | 10,502 | 12,366 | 13,700 |
| වෙළෙඳ බැංකු | | | | | |
| ණය උපකරණ අනුව | 9,659 | 23,179 | 73,654 | 78,698 | 84,671 |
| රුපියල් ණය | 414 | 413 | 24,088 | 24,840 | 24,928 |
| භාණ්ඩාගාර බිල්පත් | 9,239 | 22,760 | 49,566 | 53,858 | 59,742 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 5 | 5 | - | - | - |
| වෙනත් | 1 | 1 | - | 1 | 1 |
| ආයතන අනුව | 9,659 | 23,179 | 73,653 | 78,698 | 84,671 |
| ලංකා බැංකුව | 6,791 | 15,753 | 40,333 | 39,468 | 42,298 |
| මහජන බැංකුව | 2,182 | 2,938 | 15,690 | 18,363 | 17,802 |
| වෙනත් | 686 | 4,488 | 17,630 | 20,867 | 24,571 |
| නිදන් අරමුදල් | 840 | 359 | 239 | 137 | 100 |
| රුපියල් ණය | 840 | 359 | 239 | 137 | 100 |
| බැංකු නොවන අංශය | | | | | |
| ණය උපකරණ අනුව | 99,135 | 111,550 | 123,311 | 148,939 | 172,304 |
| රුපියල් ණය | 65,559 | 68,402 | 81,379 | 112,577 | 132,900 |
| භාණ්ඩාගාර බිල්පත් | 28,697 | 38,338 | 41,652 | 36,059 | 39,044 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර | 4,527 | 4,527 | - | - | - |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 153 | 102 | 114 | 145 | 200 |
| බදු සංචිත සහතික පත් | 9 | 8 | 8 | 7 | 7 |
| වෙනත් | 190 | 173 | 158 | 151 | 153 |
| ආයතන අනුව | 99,134 | 111,550 | 123,311 | 148,938 | 172,304 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 26,558 | 30,782 | 37,767 | 46,407 | 48,406 |
| ඉතිරි කිරීමේ ආයතන හා පුද්ගලයන් | 13,031 | 14,981 | 13,165 | 15,811 | 19,349 |
| සේ. අ. අරමුදල | 45,862 | 54,563 | 65,645 | 79,745 | 95,000 |
| රක්ෂණ ආයතන | 4,074 | 4,035 | 244 | 312 | 303 |
| මූල්‍ය සමාගම් | 2,427 | 3,131 | 5,868 | 5,942 | 8,420 |
| වෙනත් | 7,182 | 4,058 | 622 | 721 | 826 |
| දෙපාර්තමේන්තු සහ තිල අරමුදල් | 34 | 428 | 453 | 556 | 662 |
| විදේශ පරිපාලන ණය | 190 | 174 | 158 | 151 | 153 |
| වෙනත් | - | - | - | 14 | 11 |
| **මුළු විදේශීය ණය** | **214,579** | **235,539** | **270,224** | **301,812** | **345,834** |
| ස්වරූපය අනුව | 214,579 | 235,539 | 270,224 | 301,812 | 345,834 |
| ව්‍යාපෘති ණය | 166,149 | 185,003 | 216,355 | 246,075 | 286,515 |
| ව්‍යාපෘති නොවන ණය | 48,430 | 50,536 | 53,869 | 55,737 | 59,320 |
| භාණ්ඩ ණය | 46,037 | 48,550 | 52,120 | 54,147 | 57,715 |
| වෙනත් | 2,393 | 1,986 | 1,749 | 1,590 | 1,604 |
| ආයතන අනුව | 214,579 | 235,539 | 270,224 | 301,812 | 345,834 |
| සහනදායී ණය | 202,554 | 225,132 | 260,557 | 292,463 | 335,595 |
| බහු පාර්ශවීය | 78,084 | 91,067 | 109,284 | 123,016 | 144,636 |
| ද්වි පාර්ශවීය | 124,470 | 134,065 | 151,273 | 169,447 | 190,960 |
| වෙළෙඳ ණය | 12,025 | 10,407 | 9,667 | 9,350 | 10,239 |
| විදේශ සැපයුම් කරුවන්ගේ ණය | 1,260 | 1,094 | 1,065 | 950 | 1,020 |
| **නොපියවූ මුළු රාජ්‍ය ණය** | **366,698** | **405,559** | **483,909** | **550,930** | **631,593** |
| නිදන් අරමුදල් අත්හළ පසු නොපියවූ මුළු රාජ්‍ය ණය | 365,858 | 405,199 | 483,589 | 550,884 | 631,593 |

(අ) වර්ෂය අවසානයට

(ආ) 1993 දී රුපියල් දශලක්ෂ 24,088 ක දිගුකාලීන බැඳුම්කර ඇතුළත්ය.

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

සමාලෝචිත කාලසීමාව තුළදී කෙටිකාලීන ණය සියයට 17 කින් වර්ධනය විය. 1995 වර්ෂයේදී මෙබඳු ඉහළ වර්ධනයක් ඇතිවීම කෙරෙහි රජයේ මුදල් ප්‍රවාහයන්හි ඇතිවූ හිඟයන් සපුරා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මගින් ණය ගැනීම වැඩිවීම හේතු විය. භාණ්ඩාගාර බිල්පත් මත නොපියවූ වගකීම මුළු කෙටිකාලීන ණය ප්‍රමාණයෙන් සියයට 89 ක් විය. 1994 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 98,896 ක් වූ නොපියවූ භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 113,771 දක්වා වර්ධනය විය. මෙය 1995 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 16,475 ක වටිනාකම ඇති භාණ්ඩාගාර බිල්පත් අළුතින් නිකුත් කිරීම සහ රුපියල් දශලක්ෂ 1,600 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගෙවීම් නිසා ඇති වූ ශුද්ධ ප්‍රතිඵලයකි. 1994 වර්ෂයේදී අයවැය කටයුතු සඳහා රජය අළුතින් නිකුත් කල භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් දශලක්ෂ 1,700 ක් පමණි. 1992 දෙසැම්බර් 16 දින සිට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ අනුමත සීමාව රුපියල් දශලක්ෂ 125,000 මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. 1995 වර්ෂය අවසානයේදී රජයේ කෙටිකාලීන ණය වලින් ඉතිරි සියයට 11 ක ශේෂයට දායක වූ මහ බැංකු තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 13,700 දක්වා රුපියල් දශලක්ෂ 1,334 කින් වැඩිවිය.

ඉකුත් වර්ෂයේ පැවති සියයට 26 ක වර්ධන අනුපාතය හා සසඳන කල 1995 දී රුපියල් දශලක්ෂ 158,289 ක් වූ මැදි හා දිගුකාලීන ණය සියයට 13 කින් වැඩිවිය. වටිනාකම අනුව මැදි හා දිගුකාලීන ණයවල වැඩිවීමේ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17,896 ක් විය. එසේ වුවද රජයේ දේශීය ණය, කෙටිකාලීන ණය දෙසට විතැන් වීමක් පෙන්නුම් කරමින් මැදි හා දිගුකාලීන ණය කොටස 1994 දී පැවැති සියයට 56 සිට 1995 දී සියයට 55 දක්වා අඩුවිය. මෙය මැදි හා දිගුකාලීන ණය සමානුපාතිකයන්, 1992 දී සියයට 42 සිට 1993 දී සියයට 52 දක්වා ද තවදුරටත් 1994 දී සියයට 56 දක්වා වැඩි වෙමින් 1993 සිට දක්නට ලැබුන උපනතියෙහි වෙනස් වීමක් පෙන්නුම් කිරීමකි. 1994 වර්ෂයේ සමස්ත දේශීය ණය සංයුතියෙහි අන්තර්ගතව පැවති රුපියල් දශලක්ෂ 2,536 ක් වූ මැදි හා දිගුකාලීන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය ආපසු ගෙවීමත් සමග 1995 දී මැදි හා දිගුකාලීන ණය මුළුමනින්ම පාහේ රුපියල් ණය වලින් සමන්විත විය.

දේශීය ණය ප්‍රමාණයෙන් විශාල කොටසක් රුපියල් ණය නිකුත් කිරීමෙන් එක්රැස් කිරීම හේතුකොට එකී ණය උපකරණය මත නොපියවූ වගකීම් ප්‍රමාණය පෙර වර්ෂය අවසානයේදී පැවති නොපියවූ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 137,554 ට වඩා සියයට 15 කින් වර්ධනය විය. 1995 ජනවාරි මාසයේ ආරම්භ වූ 1995 වර්ෂයේ රුපියල් ණය වැඩසටහන යටතේ ණය කාණ්ඩ 10 ක් නිකුත් කිරීම මගින් රුපියල් දශලක්ෂ 46,715 ක් ලබා ගන්නා ලදී. මෙම ණය වසරකට සියයට 14 ක පොලී අනුපාතයක් සහ වසර 5-6 අතර සහ 5-7 අතර වූ මනාපය අනුව තීරණය කළ හැකි කල්පිරීමේ කාලසීමාවකින් යුක්ත විය. තවද රුපියල් දශලක්ෂ 26,329 ක රුපියල් ණය ප්‍රමාණයක් වර්ෂය තුළදී ගෙවා දමන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් ණය වැඩසටහන මගින් රුපියල් දශලක්ෂ 20,386 ක ශුද්ධ සම්පත් ප්‍රමාණයක් එක්රැස් කර ගැනීම නිසා 1995 වර්ෂය අවසානයේදී, නොපියවූ රුපියල් ණය වගකීම රුපියල් දශලක්ෂ 157,928 ක් විය. ලංකා බැංකුව සහ මහජන බැංකුව ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන යටතේ නිකුත් කරන ලද (වසර 30 කින් කල්පිරෙන) රුපියල් දශලක්ෂ 24,088 ක්වූ දිගුකාලීන බැඳුම්කරද මීට ඇතුලත්ය. සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් රුපියල් ණය වැඩසටහනේ ප්‍රධාන දායකයන් වූ අතර 1995 වර්ෂය අවසානයේදී නොපියවූ මුළු රුපියල් ණය වලින් සියයට 81 ක් එම ආයතන සතුව පැවතුණි. රුපියල් දශලක්ෂ 24,088 ක් වටිනා දිගුකාලීන බැඳුම්කර හැර සමාලෝචිත වර්ෂය තුළදී නොපියවූ රුපියල් සුරැකුම්පත් සම්පූර්ණ ප්‍රමාණයම පාහේ බැංකු නොවන අංශය සතුව පැවතුණි.

රාජ්‍ය ණය සංයුතියෙහි සැලකිය යුතු ස්ථානයක් හිමි නොවුවද භාණ්ඩාගාර තැන්පතු සහතික මත නොපියවූ වගකීම 1994 වසර අවසානයේදී පැවති රුපියල් දශලක්ෂ 145 සිට 1995 අවසානයේදී රුපියල් දශලක්ෂ 200 දක්වා වැඩි විය. මාස 06 සහ 12 ක කල්පිරීමේ කාලසීමාවක් සහිතව නිකුත් කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතිකවල ඵලදා අනුපාතිකය පිළිවෙලින් සියයට 17.15 සහ 18.06 ක් විය. විදේශීය පරිපාලන ණය ගැනීම් මත රුපියල් වගකීම රුපියල් දශලක්ෂ 153 ක් වූ අතර බඳු සංචිත සහතික පත් මත වගකීම 1995 වසර අවසානයේදී රුපියල් දශලක්ෂ 7 ක් විය.

## විදේශීය ණය

1995 වර්ෂය අවසානයේදී මුළු විදේශීය නොපිය වූ ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා සියයට 15 ක හෙවත් රුපියල් දශලක්ෂ 44,022 ක වැඩිවීමක් නියෝජනය කරමින් රුපියල් දශලක්ෂ 345,834 ක් විය. රුපියල් දශලක්ෂ 15,335 ක ශුද්ධ ණය ගැනීම් සහ විනිමය අනුපාතිකයේ විචලනය මත උද්ගත වූ රුපියල් දශලක්ෂ 28,687 වගකීම මෙම වැඩිවීමෙහි අන්තර්ගත වී ඇත. ඉකුත් වර්ෂයේදී මෙන්ම විදේශ ණය මුළු

**සංඛ්‍යා සටහන 8.6**

**විනිමය අනුපාතිකයේ විචලනයයන් විදේශීය ණය කෙරෙහි ඇති කළ බලපෑම 1991-1995 (අ)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 තාවකාලික |
|---|---|---|---|---|---|
| දළ ලැබීම් | 25,969 | 15,316 | 16,839 | 19,384 | 23,812 |
| ආපසු ගෙවීම් | 4,881 | 7,955 | 6,984 | 7,606 | 8,477 |
| ශුද්ධ ලැබීම් | 21,088 | 7,361 | 9,855 | 11,778 | 15,335 |
| විනිමය අනුපාතිකයේ විචලනය නිසා වගකීමෙහි ඇති වූ වෙනස | 16,607 | 13,599 | 24,831 | 19,810 | 28,687 |
| කාලච්ඡේදය අවසානයෙහි වගකීම | 214,578 | 235,538 | 270,224 | 301,812 | 345,834 |

(අ) ලැබුන දිනය අනුව වටිනාකම් සටහන් කිරීමේ ක්‍රමය පදනම් කොට ඇත.

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 55 ක් විය.

ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 43,132 කින් වර්ධනය වූ සහනදායි ණය මත නොපියවූ වගකීම වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 335,595 ක් විය. මෙම වැඩිවීම සහනදායි කොන්දේසි මත ලැබුණු රුපියල් දශලක්ෂ 22,634 ක්වූ විදේශීය ණය, රුපියල් දශලක්ෂ 7,161 ක්වූ ණය ආපසු ගෙවීම් සහ රුපියල් දශලක්ෂ 27,660 ක්වූ විනිමය අනුපාතිකයේ විචලනය නිසා වැඩි වූ වගකීම යන කරුණුවල ප්‍රතිඵලයකි. එසේ වුවද 1994 වර්ෂයේදී මෙන්ම, විදේශීය ණයවල ඇතුළත් සහනදායි ණය ප්‍රමාණය සියයට 97 ක් විය. ද්විපාර්ශවීය ණය රුපියල් දශලක්ෂ 190,960 කින් හෙවත් සහනදායි ණය ප්‍රමාණයෙන් සියයට 57 කින් සමන්විත වූ අතර ඉතිරි ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 144,635 ක් බහුපාර්ශවීය ගිවිසුම් යටතේ ලබා ගන්නා ලදී. වාණිජමය පදනමක් මත ලබාගත් විදේශීය ණයවල නොපියවූ වගකීම රුපියල් දශලක්ෂ 10,239 ක් විය.

1994 දී වාර්තා වූ මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 40,440 කින් වැඩි වූ ව්‍යාපෘති හා වැඩසටහන් ණයවල වගකීම රුපියල් දශලක්ෂ 286,515 ක් විය. මෙය රුපියල් දශලක්ෂ 22,246 ක්වූ ණය ලැබීම්, රුපියල් දශලක්ෂ 5,552 ක්වූ ආපසු ගෙවීම් සහ රුපියල් දශලක්ෂ 23,745 ක්වූ විනිමය අනුපාතිකයේ විචලනය මත උද්ගතවූ අතිරේක වගකීම යන කරුණුවල ශුද්ධ ප්‍රතිඵලයකි. විනිමය අනුපාතයේ විචලනයෙහි ප්‍රතිඵල වශයෙන් පැන නැගුණු රුපියල් දශලක්ෂ 4,819 ක වගකීම සහ රුපියල් දශලක්ෂ 1,251 ක ශුද්ධ ණය ගෙවීමක ප්‍රතිඵල වශයෙන් භාණ්ඩ ණය මත නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 57,715 දක්වා ඉහළ නැගිණි. ව්‍යාපෘති සහ වැඩසටහන් ණය වලින් සියයට 95 කට ආසන්න ප්‍රමාණයක් ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය මූලාශ්‍රයන් ගෙන් ලබා ගත් අතර භාණ්ඩ ණය සමස්ත ප්‍රමාණයම ද්විපාර්ශවීය මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා ලදි.

## රජයේ ණය සේවා ගෙවීම්

රුපියල් දශලක්ෂ 36,546 ක ණය ආපසු ගෙවීම් හා රුපියල් දශලක්ෂ 38,226 ක පොලී ගෙවීම් වලින් සමන්විත රජයේ ණය සේවා ගෙවීම් පසුගිය වර්ෂයට වඩා සියයට 23 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 74,772 ක් විය. ණය සේවා ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන්, 1994 පැවති සියයට 10.5 සිට 1995 දී සියයට 11.3 දක්වා වැඩිවිය. රුපියල් දශලක්ෂ 26,329 ක්වූ ඉතා විශාල රුපියල් ණය ප්‍රමාණයක් මෙම වර්ෂය තුලදී කල්පිරීම මීට හේතුවිය. 1995 දී රුපියල් දශලක්ෂ 1,600 ක්වූ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගෙවීමක්ද ඇතුලු මුළු දේශීය ණය ආපසු ගෙවීම් ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 28,069 ක් විය. 1995 දි විදේශීය ණය ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 8,477 ක් විය. ඉන් රුපියල් දශලක්ෂ 5,552 ක් ව්‍යාපෘති හා වැඩසටහන් ණය වූ අතර රුපියල් දශලක්ෂ 2,781 ක් භාණ්ඩ ණය ආපසු ගෙවීම් විය.

රජයේ අයවැය කටයුතු මත අධික බරක් පනවමින්, දේශීය ණය මත පොලී ගෙවීම් රජයේ වර්තන වියදමින් සියයට 26 ක් සහ රජයේ ආදායමින් සියයට 28 ක් විය. 1994 හා 1995 වර්ෂ වලදී අයවැය පරතරය පියවා ගැනීම සඳහා රුපියල් ණය වැඩසටහන මත රඳා පැවතීම හේතුකොට නොපියවූ රුපියල් ණය ප්‍රමාණය වැඩිවීම නිසා රුපියල් සුරැකුම්පත් මත පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 18,117 ක්වූ අතර සියයට 31 ක වැඩිවීමකින් රුපියල් ණය මත පොලී අර්ධ වාර්ෂිකව ගෙවීම හේතුවෙන් 1994 දෙවන භාගය හා 1995 ප්‍රථම භාගය තුල රුපියල් ණයවල පොලී පිරිවැය 1995 දී පිළිබිඹු විය. නොපියවූ භාණ්ඩාගාර බිල්පත් තොගයෙහි වර්ධනයක් තිබියදීත් 1994 වර්ෂයේ සියයට 40 ක ඉහළයාම හා සසඳන විට මෙම උපකරණ මත පොලී ගෙවීම් සියයට 25 කින් රුපියල් දශලක්ෂ 13,947 දක්වා පහත වැටීම කෙරෙහි, 1994 වර්ෂයේදී සහ 1995 ප්‍රථම සිව් මස තුල ඵලදා අනුපාතිකයන් සාපේක්ෂ වශයෙන් පහළ බැසීම, හේතුවූ බව පෙනේ. 1995 දි විදේශීය ණය මත පොලී ගෙවීම් සියයට 12 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 6,162 ක් විය..

**සංඛ්‍යා සටහන 8.7**

**රාජ්‍ය ණය සේවා ගෙවීම් (1991 - 1995)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995* |
|---|---|---|---|---|---|
| ණය සේවා ගෙවීම් | 39,855 | 52,018 | 57,493 | 60,702 | 74,772 |
| ණය ආපසු ගෙවීම් | 17,782 | 26,078 | 27,290 | 22,671 | 36,546 |
| දේශීය | 12,901 | 18,123 | 20,327 | 15,065 | 28,069 |
| විදේශීය | 4,881 | 7,955 | 6,963 | 7,606 | 8,477 |
| පොලී ගෙවීම් | 22,073 | 25,940 | 30,203 | 38,031 | 38,226 |
| දේශීය | 17,960 | 21,201 | 25,101 | 32,520 | 32,064 |
| කෙටි කාලීන | 10,410 | 11,923 | 13,351 | 18,712 | 13,947 |
| මැදි හා දිගුකාලීන | 7,550 | 9,278 | 11,750 | 13,808 | 18,117 |
| විදේශීය | 4,113 | 4,739 | 5,102 | 5,511 | 6,162 |
| පොලී ගෙවීමේ/වර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | 26.35 | 28.94 | 29.53 | 29.93 | 26.17 |
| ණය සේවාකරණ ගෙවීම්/දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 10.70 | 12.23 | 11.50 | 10.48 | 11.30 |

* තාවකාලික

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව